# පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු ආලොකො උදපාදි

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

# පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු ආලොකො උදපාදි

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින්

2017-08-07 නිකිණි පොහෝ දින බලංගොඩ දී
පවත්වන ලද ධර්ම දේශනය.

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

පළමුවන මුද්‍රණය - 2017 නොවැම්බර්
(පිටපත් 8,000)

**ධර්ම දානය පිණිසයි.**

**සංස්කරණය:**
එච්. ඒ අමරතුංග
දිල්රුක්ෂි වීරරත්න

**පිටපත් ලබා ගැනීමට:**
හෝමාගම - 011 2752352
මහනුවර - කේ. දයානන්ද මහතා - 077 7665198
මාතලේ බෝගහකොටුව විහාරය - 071 4466838
මාතර - කේ. ජී. මුණිදාස මහතා - 071 4438747 - 077 3295174

**ප්‍රකාශිකා:**
වෛද්‍ය ශ්‍රියානි අබේසූරිය, නාවල
(පිටපතක මුද්‍රිත වැය රු. 20/=)

**මුද්‍රණය:**
කොලිටි ප්‍රින්ටර්ස්
17/2 පැඟිරිවත්ත පාර, නුගේගොඩ
දු.ක: 011 4 870 333

# 2017-08-07 නිකිණි පොහෝ දින බලංගොඩ දී පවත්වන ලද ධර්ම දේශනය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සිල් මැණිවරුවර ප්‍රමුඛ ශ්‍රද්ධා සම්පන්න පින්වතුනි. බොහෝ දේවල් නො වෙයි, ධර්මය සම්බන්ධව බොහොම කෙටි කරුණු ටිකක් මම මතක් කරනවා. මේ ටික තේරුම්ගන්න පුළුවන් ද කියලා හැම දෙනා ම නුවණින් බලන්න කියලා මතක් කරනවා.

මම පැවිදි වෙච්චි දවසේ ඉඳලා, බොහොම ශ්‍රද්ධාවෙන් ම යි පැවිදි වුණේ සියලු සසර දුක අවසන් කරගන්න ඕනේ කියලා යි. හැබැයි සාසනයට එන කොට මට ලොකු නුවණක් තිබුණේ නැහැ. සර්වඥතා ඥානය වගේ ඥානයක් මට තිබුණෙත් නැහැ. අන්ධයෙක් කනවැල අල්ලාගෙන එනවා වගේ පිටකය අත නො හැර ම අල්ලාගෙන, අල්ලාගෙන ආවා. කලින් කලට, කලින් කලට ටිකෙන් ටික ගැඹුරු අරුත් වලින් ගැඹුරට ආවා. නමුත් මින් එහාට මගේ දේශනා කවදාවත් ගැඹුරු වෙන්නේ නැහැ. මම මේ කියන දේ ම, නොයෙක් පරියායන්ගෙන්, නොයෙක් ක්‍රම වලින් කියයි, පෙන්වයි, පනවයි, විවරණය කරයි, බෙදයි. නමුත් එයින් ඔබ්බට පරාවර්ථනය වෙන්නේ නැහැ. මගෙන් බණ අහගනිමින්, මා පිටිපස්සේ යම් කෙනෙක් ආවා නම්, හැමෝට ම කියන පණිවිඩයඃ මම මේ කියන ටික රුචි නැත්නම්, තේරෙන්නේ නැත්නම්, වෙන ක්‍රමයක් සෙව්වාට කමක් නැහැ. මට එතැනින් එහාට ගෙනයන්න ක්‍රමයක් නැහැ. තැනක් නැහැ. මේ තමයි මගේ පරියේෂණයේ නිෂ්ඨාව. මේක මෙතැනින් එහාට ජීවිතාවබෝධය ලබාදෙමින්, ජීවිතය හරහා උඩට යනවා මිසක, ලෝකය ගවේශණය කරන්න කරුණු නැහැ. බොහෝම ගැඹුරු නැහැ. වෙනදාටත් වඩා සරල යි.

හැබැයි අපි කෙනා කෙනා නිවන කියන්නේ මේක වෙන්න ඇති කියලා මනෝමයෙන් හිතාගෙන ඉන්න දේට වඩා පරස්පර වෙන්න පුළුවන්. නමුත් බුදුරජාණන්වහන්සේ දේශනා කළ ධර්ම විනයට මගේ අර්ථය පරස්පර වෙන්නේ නැහැ. ඒත් මම අද මේ දේශනාව තුළින්

බුදුරජාණන්වහන්සේගේ ධර්මයක් දේශනා කරනවා වත්, ත්‍රිපිටකයේ තියෙන ධර්මයක් දේශනා කරනවා වත්, මම හිතලා යමක් දේශනා කරනවා වත් නෙවෙයි. බණ අහන ඔය ඇත්තන්ගේ ජීවිතය ගැන යි කියන්නේ.

බුදුරජාණන්වහන්සේ දේශනා කළේ මේ ලෝකයේ දුක හැදෙන හැටිත්, ඒ දුක නැතිවෙන හැටිත්, ඒ දුක නැති කරන්න යන ගමන් මාර්ගයත්. මේ දර්ශණය මට හොඳට පෙනෙනවා, තේරෙනවා. ඒත් මම ආධුනික යි තවම. මම දක්ෂ මදි. කාලයක් යයි මට ඒකට දක්ෂ වෙන්න. නමුත් මේ ටික හොඳින් අහන්න. කල්‍යාන මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම ශ්‍රවණයෙන් කරන්නේ දුකේ නිවීම, නැත්නම් නිවන පෙන්නන එක යි. ඇස් ඇති හැම කෙනෙකුට ම දකින්න පුළුවන් නිවන. දකින ලද ධර්මය ඇතුව, දකින ලද නිවන ඇතුව, එයා මාර්ගය වඩන්නේ. එයාට කෙළවරට ගියහම, 'මගේ ගමන් මග දැන් අවසානයි' කියලා කියන්නත් පුළුවන්. ඒ නිසා ඉතාමත් උවමනාවෙන් ශ්‍රවණය කරන්න.

මේ චතුරාර්‍ය සත්‍යය ධර්මය අවබෝධ කරගන්න බැරුව ඔබත්, මමත් පැමිණි ගමන් මග සුලුපටු නෑ. ඉතාමත් දීර්ඝ යි. මම මුල ඉඳලා වෙනදා වගේ දුක ගැන විස්තර කරන්න යන්නේ නැහැ. නමුත් මම කෙටියෙන් ඔය දර්ශණය ගැන මතක් කරන්නම්.

***ජාති නිරොධො ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසා නිරුජ්ඣන්ති.*** යම් තාක් ජරා-මරණ-ශෝක-පරිදේව-දුක්-දෙම්නස්-උපායාස ධර්මයක් ලෝකයේ තියෙයි නම්, මේ සියලුම ජරා-මරණයන්ට මුල ජාතිය යි, ඉපදීම යි. ඒ ජාතිය නිරුද්ධ වුණොත්, ඉපදීම නිරුද්ධ වුණොත් ජරා-මරණ-ශෝක-පරිදේව-දුක්-දෙම්නස්-උපායාස නිරුද්ධ වෙනවා. අජරාමර වෙනවා කියලා කියන්නේ, ජරා-මරණ නැහැ. ජරා-මරණ නැතිවෙන්න නම් ජාතිය, ඉපදීම නැතිවෙන්න ඕන.

බුදුරජාණන්වහන්සේ දුක්ඛ සත්‍යය පනවන්නේ ඔතන ඉඳලා යි. ***ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛා, මරණම්පි දුක්ඛං*** කියන තැනකින්. ඒ ටික පෙන්නලා බුදුරජාණන්වහන්සේ දේශනා කළා

*පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි* කියලා. පෙර නො ඇසූ විරූ ධර්මයක් කෙරෙහි තථාගතයන් වහන්සේට ඇහැක් පහළ වුණා, ඥානය පහළ වුණා, ප්‍රඥාව පහළ වුණා, ආලෝකය පහළ වුණා, විද්‍යාව පහළ වුණා කියලා යි පෙන්නුවේ.

මම ඔය ඇත්තන්නට පෙන්නනවා, ජාතිය කියන්නේ මොකක් ද, අපි ඉපදෙන්නේ කොහොම ද, ඒ ඉපදීම නිසා දුක්-දෙම්නස් ඇතිවෙන එක කියන්න ඕන නැහැ නේ. ඊට පස්සේ ඒ ඉපදීම නැතිකරන්නේ කොහොම ද, ඒක නැතිකරන මග කියන ටික මම පෙන්නලා දෙන්නම්. නුවණක් තියෙන කෙනෙකුට දේශනාව අවසානයේ දී නිවන් දකින්න පුළුවන්.

මම පොඩි උපමාවක් කියන්නම්. ඔය ඇත්තන් සිනමා ශාලාවල් වලට ගිහිල්ලා චිත්‍රපටි බලලා තියෙනවා නේ ද? චිත්‍රපටයක් අපි බලන කොට ඉදිරියෙන් තියෙන සුදු පාට තිරය, නැත්නම් රෙද්ද විතරක් තිබුණොත් අපට පින්තූර පෙනෙන්නේ නැහැ. නෙගටිව් එකේ පැහැ සටහණ අරගෙන කැමරාව හරහා එන ආලෝකය විතරක් තිබුණොත්, තිරයක් නැති වුණොත් ඒත් අපට රූප පෙනෙන්නේ නැහැ. නෙගටිව් එකේ පැහැ සටහණ අරගෙන ආලෝක කිරණ තිරය මතට වැටුණහම අපට රූප පෙනෙනවා. ඒ පෙනෙන රූපය තිරය නො වෙයි. රූ සටහණේ ආලෝකය අරගෙන එන අර කිරණත් නො වෙයි. දෙකමත් නො වෙයි. ඒ දෙකෙන් ම බැහැරත් නො වෙයි.

නමුත් මේ ආලෝක කිරණ තිරය මත පතිත වුණොත් රූප පෙනෙයි. තිරයක් නැති වුණොත්, පොළොවක් මත පතිත වුණොත්, දිස් වෙන්න පුළුවන් පොළොවක් මත පතිත වුණොත් පෙනෙයි. ජලයක් මත පතිත වුණත් පෙනෙයි. රූ සටහන් අරගෙන එන ආලෝක කිරණ යමක් මත පතිත නො වුණොත් අපට චිත්‍රපටයක් පෙනෙන්නේ නැහැ. චිත්‍ර පෙනෙන්නේ නැහැ.

ඒ වාගේ මම අද මේ ඇත්තන්ට මතක් කරන්නේ *උපාදාන පච්චයා භව. භව පච්චයා ජාති. ජාති පච්චයා ජරා මරණ සොක පරිදෙව*

***දුක්ඛ දෙමනස්ස උපායාසා*** කියන ටික පැහැදිළි කරලා දෙන්න යි. එතැන දී අපි හැමෝට ම දැනගන්න පුළුවන් නිමිත්තක් අපි ගත්තොත් : අපි සත්ත්වයෙක්, පුද්ගලයෙක්, මනුෂ්‍යයෙක් කියන තැනක තියෙන රූපය හොඳට බලන්න. මේ කාම ධාතුව කියලා කියන්නේ, කාම භවය කියලා කියන්නේ, කාම භූමිය කියලා කියන්නේ පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන සතරමහාධාතුවෙන් නිර්මිත රූප තියෙන්නේ. අපි කිව්වොත්, අප හැමෝට ම අම්මා කෙනෙක් ඉන්න පුළුවන් නේ. ඉන්නවා නේ. හොඳට බලන්න ඒ ශරීරය ප්‍රපංච නො කොට, අපි කෙනෙක් පුද්ගලයෙක් කියන තැනක කෙස්-ලොම්-නිය-දත්-සම්-මස්-නහර කියන තද කොටස් විස්සක් තියෙනවා. මේ විස්ස ම අයිති පඨවි ධාතුවට යි. හොඳට පඨවි ධාතුව සමාන කර ගන්න කලු ගලක් ගත්තොත්, හුඹහක මැටි ටිකක් ගත්තොත්, කෙනෙක් පුද්ගලයෙක් කියලා හිතෙන්නේ නැහැ. එබඳුම ම යි, ඒ ස්වභාවය නො හැර පවතිනවා කෙස්-ලොම්-නිය-දත්-සම්-මස් කියන කොටස් ටික.

ළිඳක, වැවක, පොකුණක තියෙන වතුර ටික කෙනෙක් පුද්ගලයෙක් කියලා හිතෙන්නේ නැහැ. ඒ ස්වභාවය ම යි, ඒ ස්වභාවය නො හැර පවතිනවා පිත්-සෙම්-සැරව කියන මේ කොටස් ටික.

ගිනි ගොඩක, සූර්‍ය රශ්මියක තියෙන උනුසුම් ස්වභාවය යම් සේ ද, එබඳු යි අපි කෙනෙක් කියලා හිතන තැනක තියෙන ශරීරයේ ඌෂ්ණය.

බාහිර ගස් වැල් සොලවමින් හමන වාතය සත්ත්ව පුද්ගල භාවයෙන් තොර ධර්මතාවයක් යම් සේ ද, එසේ යි අපි පුද්ගලයෙක් කියලා දකින තැනක තියෙන වායෝ ස්වභාවය.

අපි අම්මා හෝ පුතා හෝ දරුවා කියන තැනක ශරීරය හොඳට විශ්ලේශණය කළොත්, ගවේශණය කළොත් පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන සතරමහාධාතුවෙන් යුක්ත යි ඒ රූපයේ භෞතික තත්ත්වය. රත්තරනෙන් යමක් හැදුවොත්, මොන හැඩයකට පිහිටියත් ඒක රත්තරන් ම යි. අවකාශ ධාතුව තුළ මොන හැඩයකට පිහිටියත් ඒක රත්තරන් ම යි. රිදියෙන් නිර්මාණය කළ වස්තුවක් මොන

හැඩයකට, - අවකාශ ධාතුව නිසා එක එක හැඩ පෙනෙන්න පුළුවන් - නමුත් ඒක රිදී ම යි. යකඩයෙන් කළ වස්තුවක් අවකාශ ධාතුව තුළ, මොන මොන හැඩයකට තිබුණත් ඒක යකඩ ම යි. ඒ වාගේ සතරමහාධාතුවෙන් කළ රූප මොන මොන හැඩයකට තිබුණත් ඒක සතරමහාධාතුව ම යි.

මෙතැන දී තියෙන දේ තමයි, එබඳු සතරමහාධාතු, අවකාශ ධාතුව අහුරලා රාශිවෙච්චි සතරමහාධාතු රූපවල හැඩ සටහන් අපට පෙනෙයි. ඒ පෙනෙන හැඩ සටහන් වලට අපි මනෝමයෙන් අම්මා-තාත්තා-අයියා-අක්කා කියලා ප්‍රපංච සංඥවන් උපදවා ගන්නවා. ඒ හිතේ, අපි කියමු දූන් අපට අම්මා කියලා, දරුවා කියලා, මෙතැන ඉඳන් ඔය ඇත්තන්ට සිහිකරන්න පුළුවන් නම්, ඔය සිහිකරන්න පුළුවන් ටිකට කියනවා ප්‍රපංච සංඥව, නැත්නම් තණ්හා-උපාදන කියන ගති ටික ඕකේ තියෙනවා, ඔය සිහිකරන එකේ. ඔය හිතේ තියෙන ගති ටිකට තමයි **කර්ම භවය**, නැත්නම් උපාදනය කියන්නේ. **උත්පත්ති භවය** කියලා කියන්නේ කන බොන ආහාරයෙන් හැදුණු සතරමහාධාතු රූපය යි. ඔය හිතේ තියෙන ගති ටික සතරමහාධාතු රූපයට තැබුවහම, ***උපාදන පච්චයා භව*** - එතකොට තියෙන දෝෂය තමයි **ජාතිය** - දරුවෙක්ව උපදිනවා.

ඔය ඇත්තන්ට සතරමහාධාතු පෙනෙන්නේ නැහැ. දරුවෙක් හටගන්නවා. දරුවෙක් හටගත්තොත්, දරුවෙක් උපන්නොත්, ජරා මරණ දුක, දරුවා ලෙඩවෙච්චි දුක, දරුවා මහලුවෙච්චි දුක, දරුවා මැරිච්ච දුක, දරුවාට ගහපු දුක, දරුවාට බැන්න දුක, යම්තාක් දුක් තියෙයි ද, ඒ දුක් ඔක්කෝම විඳින්න වෙයි. ඔය දුකට හේතුව ඔය ඇත්තන්ට දරුවෙක් උපන්න එක යි. ඉපදීමට හේතුව භවය කියලා කියන්නේ, කාම භවය නියෝජනය වෙන්නේ සතරමහාධාතු රූපය යි. භවයට උපාදනය ප්‍රත්‍ය වුණොත් තමන් තුළ තියෙන 'දරුවා' කියන හැඟීම සතරමහාධාතු රූපයට තැබුවොත් ඔය ඇත්තන්ට දරුවෙක්ව උපදිනවා. ජාතිය වුණොත් ජරා-මරණ දුක එන එක නතර කරන්න බැහැ ම යි කියලා එයා දන්නවා.

ඊට පස්සේ තමන් කියන රූපය ගන්න. හිතේ මේ 'මම' කියන හැඟීමට තමයි තණ්හා-උපාදාන කියන කෙලෙස් ටික කියන්නේ. ඒ කෙලෙස් ටික කන බොන ආහාරයෙන් හැදුණු සතරමහාධාතු රූපයට බැහැලුවාම තියෙන දෝෂය, 'තමන්'ව උපදිනවා. අත පය ඇති, ඇස් ඇති, කන් ඇති, නාස ඇති, කෙනෙක්ව උපදිනවා. ඉපදුනහම තියෙන දේ තමයි 'තමන්' ලෙඩ වෙනවා. මේ ශරීරයට කවුරු හරි ගැහැව්වොත් 'මට ගැහුවා' කියලා හිතෙනවා.

'මම' කියන හැඟීම මේ ශරීරයට බැසගත්තොත්, සතරමහාධාතුව උරුම වුණොත්, තියෙන දෝෂය තමයි ජාතිය. තමන් උපන්න කෙනෙක් වෙනවා. උපදිනවා. උපන්නොත් තමන්ට ලෙඩ වෙන, මහලු වෙන, මැරෙණ, නින්ද අහන්න වෙන, අපහාස අහන්න වෙන, ඇනුම්, බැනුම්, තාඩන, පීඩන - මේ සියලු ම දුක් පුද්ගලයෙකුට විඳින්න වෙනවා. මේ කයට යමක් යමක් වෙයි ද, තමන්ට විඳින්න වෙනවා.

ඒ විතරක් නෙවෙයි. කාම උපාදන කියන්නේ ඔය ඇත්තන්ට රන්-රිදී-මුතු-මැණික්-වස්තු තියෙනවා කියන හැඟීමක් තියෙයි. ඔය හිතේ තියෙන හැඟීම බාහිර සතරමහාධාතු රූපයට තැබුවහම ඔය ඇත්තන්ට වෙන්නේ රන්-රිදී-මුතු-මැණික් උපදිනවා. වස්තු උපදිනවා. ඉපදුණහම, ඒ දේවල් නිසා ඔය ඇත්තන්ට දුක් දොම්නස් එනවා. මේ ලෝකයේ යම්තාක් දේවල් නිසා අපට දුක් දොම්නස් එයි නම්, ඒ හැම දෙයක් ම අපි උපදවාගෙන පරිහරණය කරන දේවල්.

අපි නිකමට කිව්වොත්, දැන් තම තමන් අම්මාව සිහිකරන්න බලන්න. සිහි කරන කොට කන බොන ආහාරයෙන් හැදුණු කෙස්-ලොම්-නිය-දත්-සම්-මස් සතරමහාධාතු රූපය තියෙනවා නම්, මේ සිහිකරන ගතිය ඒ රූපය මත හැපිලා, 'අම්මා ඉන්නවා' කියන හැඟීම ඔය ඇත්තන්ට ඇතිවෙයි. අම්මා ඉන්නවා. බැරිවෙලා, ඔය ඇත්තන් සිහිකරන කොට, කන බොන ආහාරයෙන් හැදුණු සතරමහාධාතු රූපය නැති වෙලා නම් ඔය ඇත්තන්ට කියන්න වෙයි 'අම්මා මැරිලා' කියලා.

අම්මා ඉන්නවා සහ අම්මා මැරුණා කියලා කියන්න තියෙන වෙනස මොකක් ද කියලා හොඳට බලන්න. අම්මා සිහිකරන්න පුළුවන් මනසේ තියෙන ගතිය එක ම යි. අම්මා ඉන්නවා සහ මැරිලා කියන්නේ ජීවත්ව ඉන්න උපන්න කෙනෙක් සහ මැරිච්චි කෙනෙක් කියන්න තියෙන වෙනස සතරමහාධාතු රූපය ඇති බව සහ නැති බව පමණ යි. (මම කියන එක තේරෙනවාද දන්නේ නැහැ. හොඳට තේරුම්ගන්න බලන්න.)

මෙතැන දී එක දෙය යි බුදුරජාණන්වහන්සේ පෙන්නන්නේ. අර චිත්‍රපටයේ ආලෝක කිරණ ටික වගේ තමයි අපේ හිතේ අම්මා ඉන්නවා, තාත්තා ඉන්නවා, දුව ඉන්නවා, පුතා ඉන්නවා, නැන්දා මාමා ඉන්නවා කියලා අපේ හිතේ තියෙන මේ ගති ටික දකින්න චිත්‍රපටයක නෙගටිව් එකක රූ සටහන් අරබයා එන ආලෝකය වගේ. ඒ ගති පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන සතරමහාධාතු රූපයක හැපුණු ගමන් ම කාමභූමිය උපදිනවා. අම්ම-තාත්තා, අයියා-අක්කා, ගෙවල්-දොරවල්, යාන-වාහන, ඉඩකඩම්, මිලමුදල් උපදිනවා. උපන්නහම ඒ හැම දෙයක් ම කැඩුණු නිසා, බිඳුණු නිසා, ජරාවට ගිය නිසා, නැතිවෙච්චි නිසා, යම් තාක් දුක් වෙයි ද, ඒ තාක් දුක් විඳින්න වෙයි. එතකොට මේ දුකට හේතු ටික ඉපදීම යි. කාගෙද? ඔබෙත් මගෙත්. දැන් මෙතැන තියෙන්නේ ඔක්කෝම සතරමහාධාතු රූප ටික යි. කෙනා කෙනාගේ හිතේ තමයි තියෙන්නේ **අත්තවාද උපාදානය**. ***රූපං අත්තතො සමනුපස්සති*** කියන උපාදන ගතිය කෙනා කෙනාගේ මනසේ තියෙන්නේ. මේ සතරමහාධාතු රූපය උපාදන වශයෙන් ගත්තොත්. මේ සත්ත්වයෙක් පුද්ගලයෙක් කියන මේ හැඟීම සතරමහාධාතු රූපයට බැසගත්තොත්, වෙන්නේ මේ රූප ටිකට සත්ත්වයින් පුද්ගලයින් කියන හැඟීම උපදිනවා. එතකොට මේ රූපය කැඩෙන බිඳෙන දවසට අපට පෙනෙන්නේ පුද්ගලයින් ලෙඩ වුණා, පුද්ගලයින් මහලු වුණා, පුද්ගලයින් මැරුණා, පුද්ගලයින්ට මේ මේ දුක් වුණා කියලා සත්ත්ව පුද්ගලභාවයෙන් දුක් විඳින්න වෙනවා.

යම් වෙලාවක දී ඔය ඇත්තන්ගේ හිතේ තියෙන කාම වස්තු ගැන, සත්ත්ව පුද්ගල හැඟීම් මේ සතරමහාධාතුන්ගේ හැඩතල ටිකට

තිබ්බේ නැත්නම් පුද්ගලයින් උපදින්නේ නැහැ. තමන් උපදින්නේ නැහැ. වස්තු උපදින්නේ නැහැ. ඒ ඒ පුද්ගලයන්ගේ ඉපදීම නතර වෙනවා. ඒ ඒ වස්තුන්ගේ ඉපදීම නතර වෙනවා. ජාතිය නිරුද්ධ වෙනවා. එහෙම ඉපදීම නිරුද්ධ වුණොත් ඒ නිසා එන සෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්ස-උපායාසය නිරුද්ධ වෙනවා.

එතකොට ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා දුක දන්නවා. යමෙකු හෝ යමක් හෝ උපන්නොත් ඒ නිසා දුක එනවා ම යි කියන එක දන්නවා. ඉපදීමට හේතුවත් දන්නවා. භවය. නැත්නම් මේ සතරමහාධාතු කාම භවයේ උත්පත්ති භවය කියලා කියන්නේ සතරමහාධාතුවට යි. සතරමහාධාතු රූපයට යි. තමන්ගේ හිතේ තියෙන සත්ත්ව පුද්ගල හැඟීම සතරමහාධාතු රූපයට බහාලපු නිසා, නැත්නම් ***උපාදාන පච්චයා භව*** - භවය උපාදාන වශයෙන් ගත්ත එක යි මේ ජාතියට හේතුව කියලා දකිනවා.

ඊට පස්සේ එයා දන්නවා, මගේ හිතේ තියෙන ගතිය සතරමහාධාතු රූපයට බැහැලුවේ නැති නම් සත්ත්වයින් පුද්ගලයින් දේවල් කාරණා උපදින්නේ නැහැ. දුක උපදින්නේ නැහැ නේ ද කියලා දකිනවා. දුක ඇතිවෙන හැටිත් දන්නවා. දුක නැතිවෙන හැටිත් දන්නවා. දැනගෙන මේ රූපය හැම වෙලාවේ ම පෙන්නනවා, සතරමහාධාතුව අවකාශ ධාතුවේ රාශි වෙලා තියෙන හැඩයේ හැටියට යි එයා දකින්නේ. මේ හැඩයට කෙනෙක් කියලා හිත තබන්නේ නැහැ. එයා දන්නවා කෙනා කියන ගතියෙන් මේ සතරමහාධාතු රූපයට හිත තැබුවොත් පුද්ගලයෙක් උපදිනවා. පුද්ගලයෙක් උපන්නොත් තියෙන දෝෂය තමයි ජරා මරණ. මේ රූපය කුඩු වුණොත්, කැඩුණොත්, ඇඹරුණොත්, විනාශ වුණොත් එහෙම වෙන්න පුළුවන් රූපය. නමුත් ඔය ඇත්තන්ට පෙනෙයි කෙනෙකුට මෙහෙම වුණා කියලා දුක් විඳින්න වෙයි. ඒ පුද්ගලයෙක් ලෙඩවීම, මහලුවීම, මැරීම නිසා එන දුක් ටික ඔය ඇත්තන්ට විඳින්න වෙන්නේ පුද්ගලයෙක් උපන්න නිසා යි. පුද්ගලයෙක් ඉන්න නිසා යි. පුද්ගලයෙක් හදගත්ත නිසා යි. පුද්ගලයෙක් කියන ටික හැදිලා තියෙන්නේ ස්කන්ධ ටික සහ කෙලෙස් ටික කියන දෙක එකතු වෙලා යි. මගේ මනසේ තියෙන

තණ්හා-උපාදන - අපි කියමු දරුවා කියන හැඟීම දැන් මේ ඇත්තන් සිහි කරන්න. මේ දරුවා කියන නිමිත්තේ තියෙනවා අවිද්‍යාවෙන් හටගත්ත රූපයේ ඇත්ත නො දන්නාකම නිසා මේ දරුවා කියන හැඟීමක්, නිමිත්තක් හදාගත්තා නම් ඔය නිමිත්තට තණ්හාව ඇතිවෙයි. සත්ත්වයෙක් පුද්ගලයෙක් කියන උපාදනය ඇතිවෙයි. ඔය නිමිත්ත තුළ අවිද්‍යා-තණ්හා-උපාදන කියන මෙන්න මේ ගති ටිකයි තියෙන්නේ. ඔය ගති ටික සිහිකරගන්න කොට ම, ඔය ඇත්තන්ගේ මනස, කන බොන ආහාරයෙන් හැදුණු, කෙස්-ලොම්-නිය-දත්-සම්-මස්-නහර නැත්නම් පිත්-සෙම්-සැරව කියන සතරමහාධාතු රූපයකට නැවෙනවා. මේ හිතේ තියෙන ගතිය සතරමහාධාතු රූපය උපාදන කර ගත්තොත් දරුවෙක් උපදිනවා. ඒ රූපය දරුවෙක් වෙනවා. දරුවා හදාගත්තා වෙනවා. එතකොට වෙන්නේ දරුවා ලෙඩවෙච්ච, දරුවා මහලු වෙච්ච, දරුවා මැරිච්ච, දරුවාට ගහපු, බැනපු මේ දුක් ටික ඔක්කෝම ඔය ඇත්තන්ට විඳින්න වෙයි. ඔය දුක, දරු දුක ඔය ඇත්තන්ට නැතිවෙනවා දරුවෙක් නූපන්නොත්. දරුවෙක් නූපදින්න නම් ඔය ඇත්තන්ට යමක් කළ හැකි යි. එතැන තියෙන සතරමහාධාතු රූපය පිරිසිඳ දැකලා, හොඳට රූපයට හිත තබලා, තමන්ගේ හිතේ දරුවා කියන ගතිය ඒ රූපයට බහාලන්න ඉඩ නො දෙන විදියට රූපයේ ඇත්ත පෙන්නනවා. තමන්ගේ හිතේ තියෙන දරුවා කියන ගතිය රූපයට බහාලන්න නො දී ඇත්ත පෙන්නනවා. ඒ රූපය සතරමහාධාතු බව ඔප්පු කරලා පෙන්නන්නේ, එහෙම ඇත්ත පෙන්නන්නේ ඇයි? එයා දුක දන්නවා. එහෙම ඇත්ත පෙන්නන්න බැරිවෙන හැම වෙලාවක ම ඒ රූප මිටිය දරුවා කියලා මගේ හිතේ තියෙන ගතිය ඒ රූපයට බැසගන්නවා. බැසගත්තහම දරුවෙක් උපදිනවා. ඉපදුනහම දරුවා නිසා වෙන දුක් විඳන්න වෙනවා කියලා දන්නවා.

අපි අර කලින් කතා කරපු ටික ම කියමු. පිදුරු කෙමිකල් ටිකක් දාලා හදපු කඩදාසිය සතරමහාධාතු රූපය යි. ඒ රූපය දකින කොට රුපියල් පන්දහක් කියලා වටිනාකමකුත් එක්ක ඇතිවෙන මනසේ තියෙන නිමිත්තට කියනවා තණ්හා-උපාදන කියලා. ඒ තියෙන ගති ටික අර කඩදාසිය පැත්තට නැඹුරු කළොත් ඔය ඇත්තන්ට උපදිනවා රුපියල් පන්දහක්. පන්දහේ කොළයක් උපදි යි. පන්දහක්

උපදි යි. උපන්නොත් ඒ කොලය කැඩෙන ගානේ, බිඳෙන ගානේ ඔය ඇත්තන්ට ජරා මරණ දුක විඳින්න වෙයි.

ටීවී එකේ තියෙන රූපය දිහා බලන්න. ඒක සතරමහාධාතු රූපයක්. වර්ණ සටහණක්. ඔය ඇත්තන්ගේ හිතේ තියෙන සත්ත්ව-පුද්ගල හැඟීම ඒ රූපය මත පතිත වුණොත් ජාති. පුද්ගලයෙක් නිර්මාණය වෙයි ඔය ඇත්තන්ට. කෙනෙක් උපදි යි. ඊට පස්සේ, කෙනෙක් උපන්නොත් ටීවී එක දිහා බලාගෙන වුණත් ඔය ඇත්තන්ට ජරා මරණ දුක විඳින්න පුළුවන් වෙයි. ඒ වගේ ම යි මේ කන බොන ආහාරයෙන් හැදුනු මේ ශරීරය - හොඳට බෙදලා බලන්න කෙස්-ලොම්-නිය-දත්, මේ හැම කොටසක් ම කන බොන ආහාරයෙන් හැදුණු සතරමහාධාතු රූපය යි. මේ රූපයට 'මම' කියන හැඟීම කියන්නේ කෙලෙසයක්, මානය. අස්මී මානය කියන කෙලෙසය යි. තව පැත්තකින් ගත්තහම අත්තවාද උපාදානයක්. ඒ 'මම' කියන හැඟීම මේ රූපයට බැහැලුවාම වෙන්නේ අර පන්දහ උපන්නා වගේ 'මාව' උපදිනවා. ඇස් ඇති, කන් ඇති, නාස් ඇති, අත පය ඇති, තමන්ව උපදිනවා. උපන්නහම ඇස් අන්ධ වෙච්චි දුක, කන් කැඩිච්චි දුක, කකුල් කැඩිච්චි දුක, අතපය නැතිවෙච්චි දුක, තමන්ට වෙන සියලු දුක් විඳින්නට වේවි.

ඔය සියලු දුකෙන් පින්වතුන් මිදෙනවා, තමන් නූපන්නොත්. ඉපදුනේ නැතිනම්. නූපදින්න ක්‍රමයක් තියෙනවා. මේ රූපය පිරිසිඳ දකින්න, රූපයේ ඇත්තට හිත තබනවා, තමන්ගේ හිතේ තියෙන ගතිය රූපයට බැහැගන්න බැරිවෙන්න. එහෙම වුණොත් තමන්ව උපදින්නේ නැහැ. ඇහැ එක්ක තමන් නැහැ. තමන් එක්ක ඇහැ නැහැ. තමන්ට කන් නැහැ. කන් වලට තමන් නැහැ. එහෙම වුණොත් එයාට දුක එන්න තැනක් නැහැ.

හුඹහකින් මැටි ටිකක් කොටලා අරගෙන එක එක හැඩ වලට හදලා අවකාශ ධාතුවේ තිබ්බොත්, පින්වතුන්ට පුළුවන් ද, මැටි ටික අතට අහුවෙන්නේ නැතිවෙන්න හැඩය අල්ලන්න? හැඩය මැටි වලින් වෙන් කරන්න පුළුවන් ද? මැටි ටික අවකාශ ධාතුව තුළ තිබෙන හැඩය නේ ද ඒ? හැඩය කියන එක මැටි වලින් වෙන් කරන්න

බැහැ. අවකාශ ධාතුව තුළ මැටි ටික රාශිවෙලා තියෙන හැඩය යි ඒ. එබඳු හැඩයක් පින්වතුන්ට පෙනෙන කොට, පින්වතුන් මනෝමයෙන් හිතාගන්නවා, 'ආ මේක අශ්වයෙක්ගේ රූපයක්' කියලා. පින්වතුන් අශ්වයෙක්ගේ රූපයක් කියලා හිතාගත්තත් මැටි ටික මැටි ම නේ. හැඩෙත් මැටි ම නේ. මැටිවල හැඩය නේ. මැටි ටික තියෙන තැනට පින්වතුන් අශ්වයෙක්ගේ රූපය කියලා හිතාගෙන, 'මම අශ්ව රූපය දිහා බලනවා' කියන අදහසින් අර මැටි ටික දිහා බැලුවහම පින්වතුන්ට අශ්වයෙක්ගේ රූපයක් ඉපදිලා පෙනෙයි. අශ්වයෙක්ගේ රූපයක් උපදියි. දැන් පින්වතුන් අතින් ඇල්ලුවොත්, 'මම අශ්ව රූපය අතගානවා' කියලා, අතට අහුවෙයි මැටි ටික. නමුත් අහුවෙන්නේ අශ්ව රූපය කියලා යි හිතාගෙන ඉන්නේ. අශ්වයා උපද්දවා ගත්තහම අශ්වයාව බලන්නත් පුළුවන්. අශ්වයාගේ හඬ අහන්නත් පුළුවන්. අශ්වයාගේ ගඳ සුවඳ ලබන්නත් පුළුවන්. අශ්වයාව ස්පර්ශ කරන්නත් පුළුවන්. පංචකාමය කියන්නේ මේ නිමිත්ත අනුව ආයතන පහ ම ගැටගහගන්න පුළුවන්.

දැන් හොඳට බලන්න, අශ්වයා කියන හැඟීම පින්වතුන් ගාව තිබුණොත් මැටි වලින් යුක්ත රූපය හම්බවුණේ නැත්නම් අශ්ව රූපයක් පෙනෙයි ද? නෑ. අවකාශ ධාතුව අහුරාගෙන රාශි වෙච්චි රූපය තියෙනවා. ඕක දිහා අශ්ව රූපයක් කියලා පින්වතුන් නො බැලුවොත් අශ්ව රූපයක ඉපදීමක් වෙයි ද? නෑ. අශ්ව රූපයක් කියලා පින්වතුනුත් බලනවා, සතරමහාධාතු රූපයත් අහුවුණොත්, අශ්වරූපයක් තියෙනවා වෙන්නේ නැද්ද? උපදින්නේ නැද්ද? ඊට පස්සේ අශ්ව රූපය මෙහෙම යි කියන හැඩය තියෙද්දී ම රූපය කඩලා බිඳලා දැම්මොත්? අශ්ව රූපය උපන්න එකක් නෙවෙයි, දැන් අශ්ව රූපය නැතිවෙච්චි එකක්. ඒ අශ්ව රූපය කැඩිලා. 'අශ්ව රූපය නෑ' කියන්න වෙනවා.

ඒ වගේ, අර මැටි ටික හැදුනා වගේ කන බොන ආහාරයෙන් හැදුනු, සම්පූර්ණ මැටි වගේ සතරමහාධාතු රූපයක හැඩයක් පින්වතුන් ඉස්සරහට එන කොට, ඒ හැඩයට, 'මේ මගේ දරුවා' කියලා පින්වතුන් හිතේ නිමිත්තක් හදාගත්තහම, දරුවා කියන නිමිත්ත, හිතේ තියෙන අදහස, අර අවකාශ ධාතුවේ රාශිවෙච්චි

මැටි ටිකට තිබ්බා වගේ, අපි මේ කන බොන ආහාරයෙන් රාශිවෙච්චි මැටි ටිකට, සතරමහාධාතු රූපයට මගේ හිතේ තියෙන 'දරුවා' කියන අදහස තිබ්බහම, දරුවාගේ රූපයක් පින්වතුන්ට දකින්න පුළුවන්. දැන් දරුවෙක් ඉපදිලා. දරුවාගේ මූණ බලන්න පුළුවන්. ශබ්දය ඇහෙන කොට ඔය ශබ්දයටත් මේ දරුවාගේ කටහඬ කියලා ඔය නිමිත්ත ම තියන්න පුළුවන්. එතකොට ඇහැට පෙනුනේ නැති වුණත් කමක් නෑ. දුරකථනයකින් ඇහුනත් ඔය ශබ්දය ඇහෙන කොට ම, ඒ හඬට පින්වතුන් මේ නිමිත්ත තැබුවහම, පින්වතුන්ගේ හිතට ඒ රූපය මැවෙනවා. එතකොට අඳුරනවා 'හා දරුවායි කතා කළේ' කියලා. ඊට පස්සේ ගඳ සුවඳටත් ඔය දරුවා කියන නිමිත්ත ම තිබ්බ හැකි යි. පඨවි ධාතුව යි ස්පර්ශ වෙන්නේ - සතරමහාධාතුව අල්ලන කොටත් දරුවා කියන නිමිත්ත ම හිතෙන් සිහිකරගත හැකි යි.

පින්වතුන්ට මේ සතරමහාධාතු නිමිත්ත ඇහැ-කන-දිව-නාසය-ශරීරය කියන ආයතන පහෙන් ම දරුවා කියලා පරිහරණය කළ හැකි යි. එතකොට ආශ්වාදයකුත් තියෙ යි. නමුත් ආදීනවයක් තියෙනවා. ඒ රූපය අවකාශ ධාතුවේ ආහාර ප්‍රත්‍යයෙන් රාශි වුණේ. පඨවිය කිපිලා හෝ ආපෝව කිපිලා හෝ තේජෝව කිපිලා හෝ, වායෝව කිපිලා හෝ අවකාශ ධාතුව තුළ රාශිවෙච්චි රූප මිටිය අවකාශ ධාතුව තුළ ම ඉහිරෙනවා. ඉහිරුණු දවසට පින්වතුන්ට දරුවා නැතිවෙච්චි දුක විඳින්නට වෙයි. දරුවෙක් උපන්නොත් තියෙන දෝෂය මොකක් ද? දරුවා මැරිච්චි දුක විඳින්නට වෙනවා.

ඒ හින්ද බුදුරජාණන්වහන්සේ ජාතිය දුක යි කියලා දේශනා කළේ තමන්ගේ ඉපදීමට යි. තව සත්ත්වයින් පුද්ගලයින්ගේ ඉපදීමට යි. මනුෂ්‍යයන්ගේ ඉපදීමට යි. දේවල්, ද්‍රව්‍ය, කාරණා, රන්-රිදී-මුතු-මැණික්-යාන-වාහනවල ඉපදීමට යි ජාතිය කියලා දේශනා කළේ. මේ ජාතිය ස්වභාව කොට ඇති සියලුම ධර්මයන් නිසා මේ ඇත්තන්ට දුක එනවා ම යි. දුක නැවිල්ලා තියෙන්නේ නැහැ. දුකට හේතුව ජාතිය යි. ජාතියට හේතුව භවය කියලා කියන්නේ, කාම භවය කියලා කියන්නේ මේ සතරමහාධාතු රූපය යි. භවයට හේතුව

උපාදනය කියලා කියන්නේ ඒ සතරමහාධාතුව අරභයා, **කාම උපාදන** කියන්නේ රන්-රිදී-මුතු-මැණික් තියෙනවා කියන තමන්ගේ හිතේ ගතිය යි. **දිට්ඨි උපාදන** කියන්නේ සත්ත්ව-පුද්ගල-ආත්මීය දෙයක් කියනවා, දිගින් දිගට යන ආත්මයක් තියෙනවා කියනවා කියන ගතිය යි. **අත්තවාද උපාදනය** කියන්නේ සත්ත්වයින්-පුද්ගලයින් ඉන්නවා කියන ගතිය යි.

මේ සිතේ තියෙන ගති ටික සතරමහාධාතුවට තැබුවොත්, තියෙන දෝෂය මොකක් ද? ජාතිය වෙනවා. ජාතිය වෙනවා කියන කොට දේවල්, කාරණා, මනුෂ්‍යයින්, පුද්ගලයින් උපදිනවා ම යි. ඉපදුනහම මිනිසුන් මැරුණ, මිනිසුන් ලෙඩවෙච්ච, රන්-රිදී-මුතු-මැණික් හොරු ගත්ත, මේ දුක්, මේවා නැතිවෙච්චි දුක් විඳන්න වෙනවා ම යි. එතකොට ආර්‍ය්‍ය ශ්‍රාවකයා දුක දන්නවා, ඉපදුනොත් ජරා මරණ දුක විඳින්න වෙනවා කියලා. දුකට හේතු ටිකත් දන්නවා. තණ්හා-උපාදන-භව කියන මෙන්න මේ කෙලෙස් ටිකයි කියලාත් දන්නවා.

එතකොට යම් වෙලාවක මේ ජාතිය, ඉපදීම කියන එක නැතිවෙන්න ක්‍රම දෙකක් තියෙනවා. හිතේ තියෙන දරුවා කියන, රත්තරන් කියන ගතිය එහෙම ම තියෙද්දී සතරමහාධාතු රූපය නැති වුණොත් කියන්නේ 'මැරුණා' කියලා යි. 'දරුවා' කියන ගතිය ගෙවිලා නෑ. ඒක තියෙනවා. නමුත් ඒක පතිතවෙන රූපය දැන් නැති වුණොත් මොකද වෙන්නේ? 'මැරිලා' කියලා කියනවා. මරුණා කියන තැන දී වුණේ එක ම දෙය යි. මොකක් ද වෙලා තියෙන්නේ? මගේ හිතේ තියෙන ගතිය බහාලන්න පුළුවන් සතරමහාධාතු රූප මිටිය නැතිවෙච්චි එක විතර යි. මගේ හිතේ තියෙන ගතිය සතරමහාධාතු රූපයට බහාලන්න පුළුවන් නම් ඒ හැම දෙයක් ම උපන්න දේවල්. ජාතිය ස්වභාව කොට ඇති දේවල්. එතකොට තමන්ගේ හිතේ තියෙන ගතිය බහාලන්න සතරමහාධාතු රූපය නැති වුණොත්, මැරුණා කියනවා. හැබැයි එයා අතීත රූපය පිරිසිඳ දැක්කේ නැති නිසා ඒ ගතිය අතීත සතරමහාධාතු රූපයට බහාලා 'හිටියා' කියනවා. දැන් නෑ. හැබැයි හිටියා කියනවා. අතීත රූපයට එයා දැක්කා නම් එදත් හිටියා කියන තැනදීත් වුණේ මේක යි කියලා අතීතයක් ඇසුරුවෙන්නේ නැහැ.

එතකොට සඋපධිශේෂ නිබ්බාන කියලා කියන්නේ මේ ස්කන්ධ ටික, අපි කියමු සතරමහාධාතු රූපය තියෙද්දී ම ඒ නිසා සත්ත්ව-පුද්ගල-ආත්ම භාවයේ ඉපදීම නතර කරලා. සත්ත්ව-පුද්ගලයන්ගේ ඉපදීම නතර කරලා ඒ සත්ත්ව-පුද්ගල භාවය නිසා එන ජරා මරණ දුකෙන් නිදහස් වෙලා, අජරාමර බවට පත්වෙනවා. සත්ත්ව-පුද්ගල භාවයෙන් මිදුණු තැනට තමයි සෝපදිශේෂ නිබ්බාන කියලා කියන්නේ. ඉපදීම නතර කරලා.

අපි කියමු මේ ඉදිරියෙන් තියෙන රූපය වෙනදට අපි ඇසුරු කළේ - මේ රූපයේ සැබෑ ම ස්වභාවය, බුදුරජාණන්වහන්සේ දේශනා කළාට නෙවෙයි, අපි කිව්වාට නෙවෙයි. සැබෑ ම ස්වභාවය අපි විශ්ලේශණය කරමු, වෙනස් වෙන්නේ නැති සැබෑ ම සත්‍යය. මේ රූපයේ කෙස් තියෙනවා. කෙස් සත්ත්වයෙක්-පුද්ගලයෙක් නෙවෙයි නේ. පඨවි ධාතු බව පිළිගන්නවා නේ ද? ලොම්-නිය-දත්-සම්-මස්-නහර මේ වාගේ සම්පූර්ණ සතරමහාධාතුව අවකාශ ධාතුවේ රාශිවෙලා තියෙන එක හැඩයක් නේ ද මේ? පිළිගන්නවා නේ ද ඒක? ඔන්න ඒක තමයි කාම භවයේ උත්පත්ති භවය කියලා කියන්නේ මේ සතරමහාධාතු රූපය නියෝජනය වෙන මට්ටමට තමයි කාම ධාතුව කියන්නේ. මේ හැඩය, පුද්ගලයෙක්, සත්ත්වයෙක්, අපි කියමු දේශප්‍රිය මහත්මයා කියන හැඟීම මගේ මනසේ තියෙන කෙලෙස් ටික තණ්හා උපාදාන ටික යි. මේ කෙලෙස් ටික මේ රූපයට බැහැලුවොත් වෙන්නේ කෙනක් උපදිනවා. මේ රූපය කෙනා වෙනවා. කෙනෙක් නිර්මාණය වෙනවා. දේශප්‍රිය මහත්මයෙක් ඉන්නවා.

කෙනෙක් උපදවා ගත්තොත් තියෙන දෝෂය : රූපය යි විපරිණාම වෙන්නේ. නමුත් කෙනා ලෙඩවෙච්චි, කෙනා මහලු වෙච්චි, කෙනා මැරිච්චි දුක් විඳින්න වෙනවා කියලා දන්නවා. කෙනෙක් ලෙඩවෙලා, මහලු වෙලා, මැරිලා, බැනලා යම් තාක් දුක් වෙයි ද, ඒ දුකට හේතුව මේ පුද්ගලයාගේ ඉපදීම යි කියලා දන්නවා. උපන්න හැටිත් දන්නවා. මේ රූපස්කන්ධයට මගේ මනසේ තියෙන තණ්හා-උපාදාන කියන කෙලෙස් ටික පතිත වෙච්චි නිසා යි, ජාතිය වුණේ කියලාත් දන්නවා. තණ්හා-උපාදානය භවයකට, රූප භවයට

නැත්නම් කාම භවයට පතිත වෙච්චි නිසා, භවය උපාදාන වශයෙන් ගත්ත නිසා, උත්පත්ති භවය කියලා කියන්නේ සතරමහාධාතු රූපයට ම යි. හිතේ තියෙන කෙලෙස් ටික සතරමහාධාතු රූපය අල්ලාගත්තහම ජාතිය, පුද්ගලයෙක් ඉපදෙනවා, ඒ නිසා මේ දුක එනවා කියලා ආර්‍ය්‍ය ශ්‍රාවකයා දන්නවා.

ඉතින් යම් වෙලාවක මේ පුද්ගලභාවයෙන් එන දුක නැතිවෙන්න නම් මේ පුද්ගලයාගේ ඉපදීම නැතිවෙන්න වෙනවා. එහෙම වෙන්න නම් මේ රූපයට මගේ හිතේ තියෙන ගති ටික බැහැලුවේ නැත්නම් මට කෙනෙක් නිර්මාණය වෙන්නේ නැහැ. උපදින්නේ නැහැ. එහෙම වුණොත් ජරා-මරණ දුක නැතිවෙනවා කියලාත් දන්නවා. එයා දුකත් දන්නවා. දුක ඇතිවෙච්චි හැටිත් දන්නවා. ඒ නිසා දුක්ඛනිරොධගාමිණීපටිපදා කියලා කියන්නේ හැම වෙලාවේ ම සිහි ඇතුව මේ රූපය සතරමහාධාතු බව හිත හිතා ඉන්නවා. වෙන මොකුත් ම ඕන නැහැ. ගැඹුරකට යන්නේ නැහැ. කාම භවයේ කබලිංකාරාහාරය පිරිසිඳ දැකලා, සතරමහාධාතුව පිරිසිඳ දැකීම විතර ම යි අවශ්‍ය. නාම ධර්ම ඕනෙත් නැහැ. ස්පර්ශයෙන් වේදනා සංඥා හටගන්නවා. වේදනා සංඥා කියන්නේ මොනවා ද, ඕවා මොකුත් ම ඕන නැහැ. මේ රූපය කෙස්-ලොම්-නිය-දත් මේවා පඨවි කොටස්. පිත්-සෙම්-සැරව ආපෝ කොටස්, මේ සතරමහාධාතු රූපය නේ ද, සතරමහාධාතු රූපය අවකාශධාතුවේ රාශි වෙලා තියෙන හැඩය නේ ද මේ කියලා බලන්න. ඒ බලන කොට චතුරාර්‍ය්‍ය සත්‍යය, සම්මා දිට්ඨි පිටිපස්සෙන් එයාගේ තියෙනවා. ඇයි ඒ? මෙහෙම බලන්න බැරිවෙන හැම වෙලාවක ම කෙනෙක් පුද්ගලයෙක් කියන තමන්ගේ මනසේ ගතිය මේ රූපය මත පතිතවෙලා පුද්ගලයෙක් නිර්මාණය වෙලා දුක එනවා නේ ද කියලා දුක යි, දුක්ඛ සමුදයට යි නුවණ තියෙ යි. මම මෙහෙම සතරමහාධාතු වශයෙන් රූපය බලන කොට මගේ හිතේ තියෙන සත්ත්ව-පුද්ගල දෘෂ්ඨිය රූපය මත පතිත වෙන්නේ නැහැ. එහෙම වුණොත් කෙනෙක් නිර්මාණය වෙන්නේ නැහැ. එතකොට පුද්ගලයා නැතිවීම, ලෙඩවීම නිසා මට දුක එන්නේ නෑ කියලා නිරෝධයටත් නුවණ තියෙයි. දුක්ඛ නිරෝධයටත් නුවණ තියෙයි. ඒ තියාගෙන මේ රූපය මෙහෙම

බලනවා. බලන බලන ගානේ මෙයාට චතුරාර්‍ය සත්‍යය අවබෝධ වෙනවා.

යම් දවසක් තියෙනවා, මේ රූපය සම්පූර්ණ ම පිරිසිඳ දකින කොට කාමාශ්‍රවය ගෙව්ලා. කාම භවය ගෙව්ලා. කාම භවය සතරමහාධාතුව තුළ එයා සත්ත්වයින් දකින්නේ නැහැ. පුද්ගලයින් දකින්නේ නැහැ. දේවල් කාරණා වස්තු දකින්නේ නැහැ, කාමාශ්‍රවය ගෙවුණහම.

ඊට පස්සේ එයාට සිත සමාධි වෙනවා. මේ රූපය වගේ ම ස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදින නාම ධර්ම ටික ප්‍රකටයි එදට. කාම භූමිය කියන්නේ නාම ධර්ම වැයවෙලා රූපය හම්බ වෙනවා. නාම ධර්ම ප්‍රකට නැහැ. රූප භවය කියලා කියන්නේ මේ රූපය වැය වෙලා නාම ධර්ම හම්බ වෙනවා රූපය එයාට ප්‍රකට නැහැ. එදට මේ විදියට ම ස්පර්ශයෙන් උපන්න සංඥුවට පුද්ගලයින්, දේවල් කියන කාරණාව තැබුවහම - ඒ ස්පර්ශයෙන් උපන්න සංඥුව කියන්නේ භූමිය යි. ඒ පුද්ගලයන් දේවල් කාරණා තැබුවහම ඒ සංඥුව තුළ පුද්ගලයින් බිහිවෙනවා. ඒකට තමයි බ්‍රහ්මයෝ කියලා කියන්නේ. මේ මනුෂ්‍යයින් බිහිවෙලා තියෙන්නේ සතරමහාධාතුවෙන්. ඒ වගේ නාමධර්ම ටිකේ බිහිවෙනවා.

මේ පරියාය ම යි, මේ ක්‍රමය ම යි තියෙන්නේ බ්‍රහ්මචරියාව අවසානයේ දී එයා දන්නවා එකක්. ඒ කියන්නේ ඛීණා ජාති - ඉපදීම නතර වුණා කියලා දන්නවා. දැන් මෙච්චර කාලයක් ම සත්ත්වයින්, පුද්ගලයින්, දේවල්, කාරණා, රන්, රිදී, මුතු, මැණික් මේවා උපදවාගෙන අපි දුක් විඳිනවා. මේ ලෝකය හදාගෙන, උපදවාගෙන දුක් විඳිනවා. මම කිව්වේ ඉපදුන එකට, මැරිච්ච එකට සාක්ෂිය හැටියට - දැන් මට තාත්තා සිහිකරන්න පුළුවන්. සිහි කරන කොට මගේ මනස හැපිලා හිටින්න ආහාර ප්‍රත්‍යයෙන් හටගත්තු සතරමහාධාතු රූපයක් නැහැ. ඒ හින්දා මට කියන්න වෙනවා 'තාත්තා මැරිලා' කියලා. 'තාත්තා ඉන්නවා' කියන්න තිබුණ සාක්ෂිය මොකක් ද? මම මේ වගේ ම යි සිහි කළේ. සිහි කරන කොට මේ සිහි කරන ගතිය හැපිලා හිටින්න සතරමහාධාතු රූපයක් ආහාර

ප්‍රත්‍යයෙන් තිබුණා. තියෙන රූපයේ මේ ගතිය හැපිලා හිටියහම තාත්තා ඉන්නවා. දැන් සිහිකරන කොට සිහි කරන්න සතරමහාධාතු රූපය නැහැ. නැති වුණහම කියන්නේ 'මැරිලා' කියලා යි.

හොඳට මතක තබාගන්න, ජාතිය වෙන්න දෙ පැත්තක් ඕන. ඔක්කොම හිතෙන් කියන්න බැහැ. හිතේ විතරක් තිබුණොත් ඒකට සතරමහාධාතු රූපය අහුවුණේ නැති නම් හීනයක් වගෙයි. ඒත් ඉපදුනේ නැහැ. රූප ටික විතරක් තිබුණොත්, හිතේ ගති නැති වුණොත්, ඒත් කෙනෙක් නිර්මාණය වෙන්නේ නැහැ. දේවල්, පුද්ගලයින් නිර්මාණය වෙන්න ගති දෙකක් ඕන. ස්කන්ධත් ඕනේ. හිතේ තියෙන තණ්හා උපාදාන කියන කෙලෙස් කියන ගති ටිකත් ඕනේ. දෙක එකතු වෙච්චි තැන ජාතිය යි. තණ්හා-උපාදාන-භව-ජාති. හොඳට මතක තබාගන්න, තණ්හා-උපාදාන කියන ගතියට - භවය කියලා කියන්නේ - කාමභවය කියන්නේ සතරමහාධාතු රූපය අහුවෙන තැන යි. රූප භවය කියලා කියන්නේ ස්පර්ශයෙන් උපන් සංඥාවට රූපයක් කොට අහුවෙන මට්ටම යි. අරූප භවය කියලා කියන්නේ ස්පර්ශයෙන් උපන් නාම ධර්ම ටික අහුවෙන එක යි.

භවය නැත්නම් ඒත් ජාතියක් වෙනවා ද? ඒ කියන්නේ රූපයක් අහුවුණේ නැත්නම්? ඒත් ජාතියක් වෙන්නේ නැහැ. තණ්හා උපාදාන නැත්නම් භවය අහුවෙනවා ද? ඒ කියන්නේ මේ හිතේ තියෙන කෙලස් නැතිනම් පින්වතුන් සතරමහාධාතු රූපයක් ලඟට හොයාගෙන යනවා ද? හිතේ තියෙන කෙලෙස් ටික යි හේතු වුණේ සතරමහාධාතු රූපයක් ගාවට යන්න. රූපයයි හේතු වුණේ ඔය ඇත්තන්ට කෙනෙක්ව නිර්මාණය කරන්න. මේ ගති ටික රූපය මත පතිත වෙලා කෙනෙක්ව නිර්මාණය කරලා.

එතකොට ඔක්කෝම හිතෙයි කියන්න පුළුවන් ද? බෑ. එහෙනම් ඔක්කෝම බාහිර යි කියන්න පුළුවන් ද? බෑ. ජාතිය කියන එක පනවන්න වෙන්නේ කොහොම ද? තණ්හා-උපාදාන-භව. ජාති කියන්නේ එතකොට මොකක් ද? සතරමහාධාතු නෙවෙයි. සතරමහාධාතු රූපයට කියන්නේ උප්පත්ති භවය කියලා යි. මට දැන් 'තාත්තා' කියලා හිතෙන ආදරය සෙනෙහස හැඟීම තියන මේ ගති

ටිකට කියනවා කර්මභවය කියලා. ඒ ගති ටිකට පැලවෙන්න භූමිය සතරමහාධාතුවට කියනවා උප්පත්ති භවය කියලා. කර්මභවය උප්පත්ති භවයේ පිහිටියාම ඇතිවෙනවා මොකක් ද? ජාතිය - 'තාත්තා' ඉන්නවා. මගේ හිතේ තියෙන දේශප්‍රිය මහත්මයා, දේශප්‍රිය මහත්මයා මෙහෙම යි කියලා මගේ හිතේ තියෙන එයා පුද්ගලයෙක් සත්ත්වයෙක් කියන මේ හැඟීම් ටිකට කියනවා තණ්හා-උපාදාන-භව. තව පැත්තකින් කර්මභවය.

වී ටිකක් වගේ දෙයක් ගලක් උඩ දැම්මාට පැළවෙන්නේ නැහැ නේ. මැටි සහිත බිමක දැම්මොත් නේ පැළවෙන්නේ. ඒකට භූමියක් ඕන නේ නේ ද? ඒකට මේ කාම මට්ටමේ ආශ්‍රව ටික පැළවෙන්න සතරමහාධාතු රූපයක් ම ඕන. එතෙක් ජාතිය එන්නේ නැහැ. එතෙක් පැළවෙන්නේ නැහැ. දුව-පුතා-අම්මා-තාත්තා කියලා ඔය ඇත්තන්ට කොච්චරවත් සිහි කළ හැකියි. හැබැයි ඔය සිහි කරන හැම එකකට ම, දැන් 'දේශප්‍රිය මහත්මයා' කියලා මට සිහි කළ හැකි යි. සිහි කරන එක කර්මභවය යි. ඒ සිහිකරන ගතියට උප්පත්තිභවය කියලා කියන්නේ - කර්මභවයට තමයි තණ්හා-උපාදාන කියන කෙලෙස් ටික කියන්නේ. තණ්හා-උපාදාන. 'ඒ මහත්මයා හොඳයි' කියලා කැමැත්තක්, එයා පුද්ගලයෙක් කියන ගති ටික යි තියෙන්නේ මේ. දේශප්‍රිය මහත්මයා කියන්නේ පුද්ගලයෙක්. පිරිමියෙක්. මෙහෙම මෙහෙම හැකියාව තියෙන කෙනෙක්. විස්තර ටික ඔක්කෝම දීලා. ඒකට අහුවෙනවා, සතරමහාධාතු රූපයට තමයි උප්පත්තිභවය කියලා කියන්නේ. මගේ තණ්හා-උපාදාන ටික සතරමහාධාතු රූපයට අහුවෙන තැන තමයි ***උපාදාන පච්චයා භව*** කියලා කියන්නේ. භවය වුණොත් ජාතිය වෙනවා ම යි. මේ ගතිය, හිතේ තියෙන ගතිය රූපය මත පිහිටියොත්, කෙනා නිර්මාණය වෙලා ම යි. අතපය ඇති, ඇස් ඇති, කන් ඇති දේශප්‍රිය මහත්මයෙක් නිර්මාණය වෙලා. දැන් ඔය ඇත්තන්ට සතරමහාධාතුව එහෙම පෙනෙනවා ද මේකේ? නෑ. කෙනෙක්ව නිර්මාණය වෙලා. අඩු නැතුව ම පිහියෙන් අනින්න පුළුවන්, කන් කපන්න පුළුවන්, අත් කපන්න පුළුවන්, ඇස් බිඳින්න පුළුවන්, කෙස් උදුරන්න පුළුවන්, ගහන්න පුළුවන්, බනින්න පුළුවන්, කෙනෙක්ව නිර්මාණය වෙලා. පුද්ගලයෙකුට වද දෙන්න පුළුවන් පුද්ගලයෙක්ව නිර්මාණය

වෙලා. ගහගන්න, බැනගන්න පුද්ගලයෙක් නිර්මාණය වෙලා. දුක් විඳින පුද්ගලයෙක් ඉපදිලා. ඒ පුද්ගලයාගේ ඉපදීමට තමයි කියන්නේ ජාතිය කියලා.

මේ ජාතිය කියන එක සතරමහාධාතු රූපයට අයිති දේකුත් නෙවෙයි. මේ හිතේ තියෙන ගතියට අයිති එකකුත් නෙවෙයි. මම මතක් කළා නේ සිනමා ශාලාවේ තියෙන චිත්‍රපටය කියන්නේ, රූ සටහන අරගෙන ආලෝක කිරණත් නෙවෙයි. එහෙනම් අර තිරෙත් නෙවෙයි. ඔය දෙන්නාමත් නෙවෙයි. දෙන්නා නැතුවත් නෙවෙයි. ඒ වගේ හිතේ තියෙන ගති ටිකට තමයි අවිද්‍යා-තණ්හා-කර්ම කියලා කියන්නේ. ඒකට කන බොන ආහාරයෙන් හැදුණු මේ රූපය ප්‍රත්‍ය වුණහම අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර ටික නිසා පඤ්චඋපාදනස්කන්ධය, පුද්ගලයා උපදිනවා. පුද්ගලයෙක්ගේ ඉපදීමක් වෙනවා.

මේ උපදින පුද්ගලයා සතරමහාධාතු රූපය ද? නෑ. එහෙනම් හිතේ තියෙන මේ තණ්හා උපාදන කියන ගති ටික ද? නෑ. මෙන්න මේ ගති ටික සතරමහාධාතුවේ රූපයේ පිහිටියොත්, ඒකයි බුදුරජාණන් වහන්සේ අනුපිළිවෙළින් ක්‍රමානුකූලව දේශනා කරන්නේ. තණ්හාව උපාදනයට හේතු යි. කාම උපාදනය කියන්නේ රන්-රිදී-මුතු-මැණික් තියෙනවා කියන ගති යි. දිට්ඨි උපාදනය කියන්නේ කුසලාකුසල කර්ම කරමින් දිගින් දිගට යන සත්ත්වයින් පුද්ගලයින් ඉන්නවා කියන ආත්මීය හැඟීම යි. අත්තවාද උපාදනය කියන්නේ සත්ත්වයෙක්, පුද්ගලයෙක් කියන හැඟීම යි.

එතකොට මේ ගති ටික සතරමහාධාතු රූපයකට බැහැලුවහම වෙන්නේ මොකක් ද? ජාතිය ඇතිවෙනවා. උපන්නොත් තියෙන දෝෂය මොකක් ද? ජරා-මරණ දුක යි. ජරා-මරණ දුක, පුද්ගලයෙක් ලෙඩ වෙලා, මහලු වෙලා, මැරිලා; තමන් ඉපදිලා, ලෙඩ වෙලා, මහලු වෙලා, මැරිලා, අම්ම, තාත්තා ඉපදිලා, ලෙඩ වෙලා, මහලුවෙලා, මැරිලා එන දුක් ටිකට හේතුව මොකක් ද? ජාතිය යි. කාගෙ ජාතිය ද? තමන් ඉපදීම යි. අම්මාගේ ඉපදීම යි. පුද්ගලයෙක් ගේ ඉපදීම යි. මනුෂ්‍යයෙක් ගේ ඉපදීම යි. ඉපදීමට හේතුව මොකක්

ද? භවය යි. භවය කියලා කිව්වේ මොකක් ද? කාම භවය? සතරමහාධාතු රූපය විතරම ම යි ගන්නේ. හොඳට මතක තබා ගන්න, සතරමහාධාතු රූපය. භවයට ප්‍රත්‍යය වුණේ මොකක් ද? මොකක් ප්‍රත්‍ය වීමෙන් ද භවයට ආවේ? හිතේ තියෙන තණ්හා-උපාදාන (තණ්හා-උපාදාන කියන කොටත් නිකම් දකින්න එපා.) අර මම කිව්වේ පන්දහ කියලා දකින කොට වටිනාකමත් එක්කයි තියෙන ගතිය වගේ, දරුවා කියලා ආදරය සෙනෙහස කියන ගති, දරුවා කියන නිමිත්ත සිහි කරන කොට හිතේ තියෙනවා නේ ද කැමැත්තක්? බාහිර වස්තුවක් නැතුව ම හිතේ කැමැත්ත තියෙනවා නේ ද? තණ්හාව කියන එක තනිවම තියෙන්නේ නැහැ. යම් වැඩක් කරලා තියෙන්නේ. නිමිත්තක් එක්ක. දරුවා කියලා තණ්හාව කැටි වෙච්චි ඒ නිමිත්තට, සත්ත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවා කියලා හිතේ තියෙන ඒ ගතියට යි තණ්හා-උපාදාන කියන්නේ. ඒ තණ්හා-උපාදාන කියන හිතේ ගතිය විතරක් තිබුණොත්, සතරමහාධාතු රූපයක් අහු නො වුණොත්, ඔය පින්වතුන්ට සැප දුක් විඳින්න කෙනෙක්ව උපදියි ද? හොඳට පැහැදිළි ද ඒක? ඔය ගතියට සතරමහාධාතු රූපය අහුවුණොත් කෙනෙක් ව උපදිනවා ම යි නේ ද? එදට සතරමහාධාතු රූපය විපරිණාම වුණාට ඔය ඇත්තන්නට පෙනෙන්නේ කෙනෙකුට වුණා වගෙයි.

ආයඍ ශ්‍රාවකයා ***දුක්ඛෙ ඤාණං***. දුක දන්නවා. ***ජාති පි දුක්ඛා ජරා පි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා*** කියලාත් දන්නවා. ***දුක්ඛ සමුදයෙ ඤාණං***. තණ්හා-උපාදාන-භව මේ දුකට හේතුව යි කියලාත් දන්නවා. නිවනත් දන්නවා. මොකක් ද නිවන? ***ජාති නිරොධො*** - ඉපදීම නැති වුණොත් ජරා-මරණ පෙනෙන්නේ නැහැ. අජරාමර නිවන දන්නවා. ජරා-මරණ නැති නිවන. මොකක් වුණොත් ද? ජාතිය නැති වුණොත්. ජාතිය නැතිවෙනවා කියලා දන්නවා, මොකක් ද? භවය අහු නො වුණොත්. භවය කිව්වේ සතරමහාධාතු රූපය අහු නො වුණොත්. මොකේට ද? උපාදාන වශයෙන් නො ගත්තොත්. සතරමහාධාතු රූපය උපාදාන වශයෙන් නො ගත්තොත් මොක ද වෙන්නේ? භවය නෑ. භවය නැති වුණොත් ජාති නෑ කියලාත් දන්නවා.

එයා දුකත් දන්නවා. දුකේ ඇතිවීමත් දන්නවා. දුක නැතිකම, ජාති නිරෝධයෙන් ජරා-මරණ දුක් නිරුද්ධ වෙනවාත් කියලා දන්නවා. නිරෝධයත් දන්නවා. දුකට යන මගත් දන්නවා. එහෙනම් මොකක් ද? භවය උපාදන වශයෙන් නො ගන්න ඕන. ඒ නිසා දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදව. කාම ධාතුවේ දී තියෙන්නේ සතරමහාධාතුව පිරිසිඳ දකින්න විතර ම යි. වෙන මොකුත් වැඩ නැහැ. මේ හැම රූපයක් ම, සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක, මේ වස්තුව වුණත්. මේ වස්තුව සතරමහාධාතු යි. පුටුව කියන හැඟීම මගේ හිතේ තියෙන්නේ - කාම උපාදනය යි. කාම උපාදනය මේ වස්තුව මත පතිත වුණොත්, ජාති යි. මොකක් ද ජාතිය? පුටුව කියන එක උපදිනවා.

හොඳට මතක තියාගන්න, මෙහෙ වස්තුවක් උපන්නත්, මෙහෙ පුද්ගලයා උපන්නත් මෙහෙ පුද්ගලයෙක් උපන්නත්, වස්තුව උපන්නත්, පුටුව දකින්නා, පරිහරණය කරන්නා උපදිනවා. පුටුව කියන එක උපන්නොත් තියෙන දෝෂය මොකක් ද? ජරා-මරණඃ පුටුව කැඩිච්ච, පුටුව විනාශ වෙච්ච, ගිනි ගත්ත, හොරු ගත්ත, දුක් විඳින්න වෙයි. එනවා නේ ද?

එතකොට ඔන්න ඔය ටික - එයා දුකත් දන්නවා. ඉපදීම දුක යි කියලාත් දන්නවා. ඉපදීමට හේතු ටික තණ්හා-උපාදන-භව කියලාත් දන්නවා. තණ්හා-උපාදනය භවයට ප්‍රත්‍ය නො වුණොත් උපදින්නේ නෑ, එහෙම වුණොත් ජරා-මරණ දුක නෑ කියලාත් දන්නවා. ඒ නිසා භවය උපාදන වශයෙන් නො ගන්න විදියට, ***න ච කිඤ්චි ලොකෙ උපාදියති***. හැම රූපයක් ම උපාදන වශයෙන් ගන්නේ නැහැ. එයා හැම රූපයක් ම සතරමහාධාතු කියලා බලනවා. මේ රූපය ඇල්ලුවත් සතරමහාධාතු කියලා බලනවා. මේ හැම රූපයක් ම සතරමහාධාතු කියලා බලනවා.

දරුවා කියලා සිහි වෙන කොට ම මේ මනසේ තියෙන ගතිය සතරමහාධාතු රූපයේ හැපෙන්න දෙන්නේ නැහැ. නෑ, එතැන තියෙන්නේ සතරමහාධාතුවක් නේ කියලා බලනවා. බලන්න හේතුවත් එයා දන්නවා. ඇයි? බැරිවෙලා දරුවා කියලා සිහිවෙන

කොට එතැන සතරමහාධාතු බව පෙන්නන්න බැරි වුණොත් මගේ මනසේ ගතිය ඒ රූපය මත හැපිලා දරුවා උපද්දනවා නේ ද? ඉපදුණොත් දරුවා මළ දුක මට විඳින්න වෙනවා නේ ද? මම දුක උපද්දවාගෙන දුක් විඳිනවා නේ ද කියලාත් දන්නවා.

දරුවා කියලා සිහිවෙන කොට, නෑ එතැන තියෙන්නේ සතරමහාධාතු රූපය කියලා පෙන්නනවා. එහෙම පෙන්නුවාට හිත පිළිගන්නේ නැත්නම් තමන් ඔප්පු කරලා පෙන්නනවා, හොඳ යි. මම දරුවා කියලා අල්ලන්න ගියොත් කෙස් අල්ල යි. කෙස් කියන්නේ පඨවි ටික නේ. අත අල්ලනවා කියන තැන, ඔන්න හම අහුවෙයි. හම කියන්නේ පඨවි නේ. මස් ටික අල්ලයි, පඨවි නේ. දරුවා කියලා මම අල්ලන්නේ කොතැන ද කියලා රූපය ගාවට ගිහිල්ලා නුවණින් අල්ලලා පෙන්නනවා. අල්ලන අල්ලන හැම තැනම අහුවෙනවා - මේක පඨවි නේ. කනෙන් ඇල්ලුවා කියන්න කෝ. මේ හම. කන කියන තැන හම තියෙනවා නම් පඨවි. එක්කෝ මස් පඨවි. ලේ ආපෝ. මේ විදියට පෙන්නනවා. එතකොට එහෙම පෙන්නන කොට තමන්ගේ හිත බහාලන්න බැහැ 'දරුවා' කියලා.

එහෙනම් මේ රූපය සතරමහාධාතුයි කියලා පෙන්නන්නේ ඇයි? මේ කෙලෙස් ටික, තණ්හා උපාදන කියන ටික මේ භවය මත, රූපය මත පතිත නො වෙන්න යි. ඇයි පතිත නො වෙන විදියට බලන්නේ? පතිත වුණොත් ජාතිය ඇතිවෙනවා කියලා දන්න නිසා ම යි. පතිත නො වුණොත් ජාතිය නෑ. කාගෙ ජාතිය ද? දරුවෙක් ගේ ඉපදීම නැහැ. ඉපදීම නැති වුණොත්? ජරා මරණ නැහැ. කාගේ ජරා මරණ ද? දරුවා ලෙඩවීම, මහලු වීම, මැරීම නිසා එන දුක නෑ කියලා ආයර්‍ය ශ්‍රාවකයා දන්නවා. ***දුක්ඛෙ ඤාණං*** - ආයර්‍ය ශ්‍රාවකයාට හොඳට දුක පිළිබඳ නුවණක් තියෙ යි. ***දුක්ඛ සමුදයෙ ඤාණං*** - දුක නැතිවීම පිළිබඳව හොඳට ඤාණයක් තියෙ යි. ***දුක්ඛ නිරොධෙ ඤාණං*** - දුක් නිරෝධය පිළිබඳව, අජරාමර බව පිළිබඳවත් නුවණක් තියෙ යි. ***දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදය ඤාණං*** - දුක් නැතිවීම පිළිබඳ, මාර්ගය පිළිබඳ නුවණක් තියෙ යි.

මේ මාර්ගයේ දී කාමභූමියෙන් එතෙර වෙන්න බොහෝ දේ එපා. සතරමහාධාතු රූපය විතරක් ඔප්පු කරලා පෙන්නන්න. හැබැයි ආධ්‍යාහාරයෙන් ඔය ඇත්තන්ගේ අර්ථය තියෙ යි. මේ රූපය අල්ලන

කොට පඨවි ධාතුව, පඨවි ධාතුව එක්ක ස්පර්ශ වුණා නේ කියලා යි බලන්නේ. බලන එක තුළ තියෙනවා චතුරාර්ය සත්‍යය. ඇයි? මෙහෙම බලන්න බැරිවෙන හැම වෙලාවක ම පුටුව කියන, මගේ මනසේ තියෙන කාම උපාදනය මේ වස්තුව මත පතිත වෙලා, පුටුවක් නිර්මාණය කරලා පුටුව කැඩුණු, හොරු ගත්තු, බිඳුණු, දුක ගෙනැත් දෙනවා මට කියන එක දන්නනවා. මේ ගතිය මගේ මනසේ, පුටුව කියන ගතිය මේ ධාතුව මත පතිත වෙන්න දුන්නේ නැත්නම් ජාතිය නෑ. භවය අහුවුණේ නැතිනම් ජාතිය නෑ. පුටුවක් උපදින්නේ නැහැ. එහෙම වුණොත් පුටුව කැඩුණු, බිඳුණු, දුක විඳින්න වෙන්නේ නෑ නේ ද කියලා දන්න නිසා යි මේ පඨවි ධාතුව පඨවි ධාතුව එක්ක ස්පර්ශ වෙනවා නේ ද කියලා බැලුවේ. බලන්න විතරයි ඕන දිගට ම. එතකොට මේ විදියට තමන්ගේ හිතේ තියෙන ගතිය රූපය මත බහාලන්න නො දී, සතරමහාධාතුව උපාදන වෙන්න නො දී, ධාතුව පිරිසිඳ පෙන්නනවා නම් පෙන්නන්න, පෙන්නන්න මනසේ තියෙන කාමාශ්‍රව කියන මෙන්න මේ ගති ටික, නැත්නම් මෙන්න මේ කෙලෙස් ටික ගෙවෙනවා. සතරමහාධාතු ටික පිරිසිඳ දකිනවා. එතකොට එදාට කාමභවයෙන් එතෙර වෙනවා.

ඊට පස්සේ ස්පර්ශයෙන් උපදින නාම ධර්ම ටිකත් ඔය වාගේ ම ප්‍රකට යි. හැබැයි, ඔය මට්ටමට තමයි දුක. ඔය ටික ගෙවාගත්තා නම් ඉතුරු ටික දන්නවා.

මේ නාම ධර්ම ටිකෙත්, වේදනා-සංඥා-සංඛාර කියන නාම ධර්ම එදාට යි ඔය ඇත්තන්නට ප්‍රකට. අදත් නාම ධර්ම ටික තියෙනවා. නාම ධර්ම වල දූන් රූප නේ හම්බ වෙන්නේ. ඒ හින්දා රූපය විතරයි ඔය පින්වතුන්ට ඕනේ. නාම ධර්ම මොකක් ද කියලාවත් බලන්න යන්න අවශ්‍ය නැහැ. වේදනාව කියන්නේ මොකක් ද කියලාවත් හොයන්න ඕන නැහැ. ඒක වෙන වෙන පරියායන්. නමුත් කාම භූමියෙන් එතෙර වෙන්න සතරමහාධාතු බව විතරක් ඔප්පු කරලා පෙන්නන්න.

හොඳට මතක තබාගන්න: බිම වැටිලා තියෙන කොළ කැල්ලක් පෙණුනත් ජාතිය කියලා දකින්න. ඇයි? සතරමහාධාතුන්ගේ හැඩය තියෙන තැනක කොළ කැල්ල කියන මගේ ගතිය ඒ මත පතිත

වෙලා 'කොලය' කියන එකක් ඉපදිලා. එතකොට මේ ලෝකයේ යම් තාක් දේ අපට හම්බ වෙයි ද, ලෝකය තුළ ඔක්කෝම ඉපදීම ස්වභාව කොට ඇති ධර්ම යි. ජාතිය ස්වභාව කොට ඇති ධර්ම යි. ඒ හැම දෙයකින් ම දුක එනවා. ඇහැ-කන-දිව-නාසය-ශරීරය-අත-පය-තමන් මේවා ඔක්කෝම ජාතිය ස්වභාව කොට ඇති ධර්ම යි. ජාතිය වුණොත්, උපන්නොත් දුක එනවා ම යි කියන එක දකින්න. එහෙම දකලා ජාති නිරෝධයෙන් ජරා-මරණ-සෝක-පරිදේව-දුක්-දෙම්නස් නිරුද්ධ වෙනවා කියලා දකින එක තමයි නිවන කියලා කිව්වේ. ජාති නිරෝධය යි. එයා සතරමහාධාතු රූපයත්, නාම ධර්ම ටිකත් පිරිසිඳ දකලා, කාම භවයෙත්, රූප භවයෙත්, අරූප භවයෙත් ඉපදීම නැති කරනවා. රහතන් වහන්සේ කියන්නේ ***ඛීණා ජාති*** - ඉපදීම නැති කළා කියලා සිංහ නාද කරන්න පුළුවන්. යමක් සඳහා බ්‍රහ්මචරියාව පිරුවා නම් ඒ බ්‍රහ්මචරියාව පුරලා අවසන්. මත්තේ කළ යුත්තක් නෑ කියන නුවණ එනවා. ඕකට කියනවා සෝපදිසේස නිබ්බාන කියලා. ඇයි දැන් සතරමහාධාතුව, නැත්නම් නාම-රූප කියන ධර්මතා දෙකකට හිත තබලා නේ අපි සත්ත්ව-පුද්ගල භාවයේ ඉපදීම නතර කළේ. තව ස්කන්ධ ටිකක් තියෙ යි. ඒ ස්කන්ධ ටික නිසා ශීත-උෂ්ණ-බඩගින්න-පිපාසාව විඳින්න වෙනවා. ඔය ස්කන්ධ ටිකේ ඉතිරිය තියෙද්දිත් කෙලෙස් නිසා එන දුකෙන් මිදුන ටිකට යි මේ කිව්වේ සෝපදිසේස නිබ්බාන කියලා. කෙලෙස් නිසා එන දුකෙන් මිදුනා. සත්ත්ව-පුද්ගල භාවයෙන් මිදුනා.

ඔතෙන්ට විතරයි බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කරන්නේ.

මේ කය ආයු ඇති තාක් තිබිලා කලම යි ප්‍රතිසන්ධියට යන කෙලෙස් නිමිති නැති කරලා තිබුණේ. ජීවිත අවසානයේ දී මේ ස්කන්ධ ටිකත් නිරුද්ධ වෙලා යනවා. මතු ස්කන්ධයන්ගේ ඉපදීමක් වෙන්නෙත් නැහැ. ඒකට කියනවා අනුපදිසේස පරිනිර්වාණය කියලා. සෝපදිසේස නිබ්බාණය සාක්ෂාත් කරගත්ත කෙනාට අනුපදිසේස පරිනිර්වාණය සඳහා කටයුත්තක් නැහැ. ඒක වෙන දෙයක්. දැන් මේ සතරමහාධාතු යි කියන තැනට හිත තබලා මම සත්ත්ව-පුද්ගල භාවය ඉපදීම නැති කළාට, ස්කන්ධයන්ගේ යථාභූත ස්වභාවය සිහි කරමින් මම ජීවත් වෙනවා. රහතන් වහන්සේ කියලා කියන්නේ සත්ත්ව-පුද්ගල භාවයෙන් එන දුකෙන් මිදිලා.

උන්වහන්සේ අම්මා මැරිලා, තාත්තා මැරිලා, දරුවා මැරිලා, රන්, රිදී, මුතු, මැණික් නැතිවෙලා එන දුක් උන්වහන්සේට නැහැ. හැබැයි දුක් ටිකක් ඉතුරු යි. මේ කය කෙළවර කොට ඇති දුක තියෙනවා. සීත දැනෙනවා, උෂ්ණ දැනෙනවා. බඩගින්න පිපාසාව දැනෙනවා. කන් කැක්කුම් දැනෙනවා. හැබැයි ඒවා මගේ නෙවෙයි. 'මම' ඉපදිලා නැහැ නේ. ඒ ස්කන්ධ දුකක්. ඉවසන්න පුළුවන්. ඉවසිය හැකි යි, යැපිය හැකි යි. ජීවිත අවසානයේ දී දුක් වූ ස්කන්ධ ටිකත් නිරුද්ධ වෙනවා. ඒ නිසා ස්කන්ධයන්ගේ ඉපදීමක් නැහැ.

අපි මේ ලෝකයට සත්ත්වයින් පුද්ගලයින් වශයෙන් පින්වතුන්වත්, මමවත් කවුරුවත් උපන්නේ නැහැ. පෙර ජීවිතයේත් මේ වාගේ ම අම්මා-තාත්තා-අයියා-අක්කා-දුව-පුතා ඉන්නවා කියන පුද්ගලභාවය ඇතිකරගෙන, එතැනත් සත්ත්ව-පුද්ගල භාවයෙන් අපි දුක් වින්ද. මරණාසන්න මොහොතේ දී ඒ පුද්ගලභාවය එතැන අතහැරුණාට විඤ්ඤාණය නාම-රූප වශයෙන් බැසගෙන ස්කන්ධයන්ගේ හටගැනීමක් වුණා. ප්‍රතිසන්ධි වශයෙන් ආවේ ස්කන්ධයන්ගේ හටගැනීමක්. හටගත්ත ස්කන්ධ ටිකේ අද ඇත්ත ඇති හැටියේ නො දන්නා කමෙන් ඇති කරගෙන කර්ම නිමිති, ඒකට තණ්හා-උපාදාන වෙලා. ඒ අවිද්‍යා-සංඛාර-තණ්හා-උපාදාන කියන ගති ටික අර ස්කන්ධ ටිකට බහාලා යි අද අපි ජාතිය ඇතිකරගෙන පුද්ගලභාවයෙන් දුක් විඳින්නේ. මෙහෙම පුද්ගල භාවයෙන් දුක් වින්දෙත් තියෙන දෝෂය, පුද්ගල භාවයෙනුත් දුක් විඳලා, ජීවිත අවසානයේ දී, ආයෙත් ස්කන්ධයන්ගේ ඉපදීමකුත් වෙනවා. මේ වාගේ කයකුත් සවිඤ්ඤාණක වෙනවා.

ජාතිය දෙ ආකාරයි. ඒ ඒ සත්ත්ව-පුද්ගලයන්ගේ ඉපදීමකුත් තියෙ යි. ස්කන්ධයන්ගේ ඉපදීමකුත් තියෙ යි. හැබැයි බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කළේ ක්ලේශ පරිනිර්වාණයට විතරයි. ජාති - ***තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්ත නිකායෙ ජාති***. ඒ ඒ සත්ත්ව නිකායේ ඉපදීමක්. ඔය ඇත්තන් මනුෂ්‍යයින් අතරේ ඉපදිලා නම්, මේ සතරමහාධාතුව රූපය තිබුණොත්, කෙලෙස් ටික පතිත නො වුණොත්, මේ පින්වතා මනුෂ්‍යයෙක් වෙලා උපදියි ද? නෑ. සතරමහාධාතු රූපය ද මනුෂ්‍යයා? හිතේ තියෙන කෙලෙස් ටික ද මනුෂ්‍යයා? නෑ. මේ දෙක එකට එකතු වුණහම ජාති. මේ කෙලෙස්

නැති වුණොත් මේ ඇත්තන්ට මනුෂ්‍යයින් කියන්නත් බැහැ. මනුෂ්‍යයන් ගාව තියෙන කෙලෙස් ඔය ඇත්තන් ගාව නැහැ. ඔය ඇත්තන්ට දෙවියෙක් කියලා කියන්නත් බැහැ. දෙවියෙක් ගාව තියෙන කෙලෙසුත් පින්වතුන්ට නැහැ. ඔය ඇත්තන්ට බ්‍රහ්මයෙක් කියලා කියන්නත් බැහැ. බ්‍රහ්මයෙක් ගාව තියෙන කෙලෙසුත් පින්වතුන්ට නැහැ. මේ ලෝකයේ ඔය පින්වතුන්ට පනවන්න කෙනෙක් නැහැ. ***නත්‍ථි තෙසං වට්ටං පඤ්ඤාපනාය*** ඔවුන්ට පනවන්න වට්ටයක් නැහැ.

පින්වතුන්ගේ කෙලෙස් ටික ඕදරික සතරමහාධාතුවේ පිහිටන තාක් පින්වතුන් කාම භූමියේ, හැබැයි ප්‍රේත වෙන්න පුළුවන්, අසුර වෙන්න පුළුවන්, තිරිසන් වෙන්න පුළුවන්, නිරයේ වෙන්න පුළුවන්, මනුෂ්‍යයින් වෙන්න පුළුවන්, දේව වෙන්න පුළුවන්. පින්වතුන්ගේ හිතේ තියෙන කෙලෙස් ටික උපාදය රූපයක් මත පිහිටන තාක් පින්වතුන් රූපී බ්‍රහ්මලෝකයේ. පින්වතුන්ගේ කෙලෙස් ටික සංඥාවක් මත පිහිටන තාක් පින්වතුන් අරූපී බ්‍රහ්මයෙක්. පින්වතුන්ගේ කෙලෙස් ටික මේ විපාක නාම රූප දෙකේ - විපාක නාම රූප දෙක කියලා කියන්නේ පෙනෙන වෙලාවේ දී ඇහෙන, ගඳ සුවඳ දැනෙන, රස විඳින, ස්පර්ශ ලැබෙන, විපාක වූ මනෝ විඤ්ඤාණය කියන ආයතන හයට තමයි නාම-රූප කියලා කිව්වේ.

මම ඒක හැදෙන පැත්ත මේ ඇත්තන්ට පෙන්නුවේ නැහැ. ඒක පැටලෙන හින්ද. දැනට මේ ටික විතරක් ගන්න. තණ්හා-උපාදන-භව-ජාති නැත්නම් උපාදන-භව-ජාති කියන ටික පැහැදිලි ද? ජරා-මරණ පැහැදිලි ද? ඔය ඇත්තන්ට දුක තේරෙනවා ද දැන්? දුක්ඛෙ ඥානය තියෙනවා ද? ***ජාතිපි දුක්ඛා*** - ඉපදුණොත් දුකක් කියන එක? ඉපදීම තේරෙනවා ද? ඉපදුනේ කොහොමද කියන එක තේරෙනවා ද? කොහොම ද ඉපදුනේ? ඉපදීමට හේතුව භවය යි. භවය කියන කොට හොඳට ගන්න කාම භවය අයිති මොකක් ද? සතරමහාධාතු රූපයට තමයි උත්පත්ති භවය කියලා කිව්වේ. භවයට එන්න වුණේ කුමක් ප්‍රත්‍ය වීමෙන් ද? සතරමහාධාතු රූපය හම්බ වුණේ? තණ්හා-උපාදනයෙන්. බුදුරජාණන්වහන්සේ දේශනා කළාට නෙවෙයි, තමන් ම ගන්න.

දැන් 'අනේ මගේ දරුවා ඉන්නවා. දරුවා බලන්න ඕනේ' කියන කොට අවිද්‍යාවෙන් හටගත්ත කර්ම නිමිත්තේ තණ්හා-උපාදාන කියන ගති ටික තියෙයි. ඔය ටික නිසා මේ ඇත්තන් යනවා, කොහාට ද? දැන් මෙහෙම තිබුණොත් දරුවා ඉන්නවා නෙවෙයි. කන බොන ආහාරයෙන් හැදුනු කෙස්-ලොම්-නිය-දත්-සම්-මස්-නහර කියන සතරමහාධාතු රූපයක් ඉස්සරහට යන කොට, මේ ගති ටික ඒ රූපය මත පතිත වෙන කොට මොක ද වෙන්නේ? දරුවා උපන්නා. ඊට පස්සේ ඉතින් වඩාගන්නවා, හුරතල් කරනවා, දරුවාව. කාමයේ ආශ්වාදය යි ඒ. මේ දරුවා කියලා හුරතල් කරනවා, වඩාගන්නවා, දැන් මේ සතරමහාධාතු රූප මිටියේ. පුංචි ළමයි, පොල්කටු වලට වැලි දලා පිඟන් කටු කෑලි, කඩදාසි කෑලි දලා, සෙල්ලම් ගෙවල් හදලා සෙල්ලම් කරන්නාක් මෙන් සතරමහාධාතුවේ අපිත් සෙල්ලම් කරනවා. සෙල්ලම් ගෙවල් හදාගෙන ඉන්නවා. 'මේ මගේ දරුවාලු ඈ'. 'මේ මගේ බිරිඳලු ඈ' කියලා. ඒ සෙල්ලම් ගෙය කැඩුණු දවසට ළමයින් අඬනවා නේ ද? ඒ වාගේ අපිත් අඬනවා. මෙතැන හැබැයි ආශ්වාදයක් තියෙනවා. ආදීනව බොහෝ යි. ඒ ගති ටික සතරමහාධාතු රූපයට තබලා දරුවාගේ මුහුන බලන්නත් පුළුවන්. දරුවා ඉඹින්නත් පුළුවන්. ඒ කියන්නේ කාය සම්පස්සයට පඨවි ධාතුවට පඨවි ධාතුව ස්පර්ශ වෙන කොටත් මට 'දරුවා' කියන සංඥුව වහාම සිහිකරගත හැකි යි, දරුවා ඉඹිනවා කියලා. එතකොට හඬ ඇහෙන කොටත්, හඬටත් මට මේ නිමිත්ත සිහි කර ගත හැකි යි. දරුවාගේ මුහුණ බලන්න පුළුවන්, දරුවාගේ හඬ අහන්න පුළුවන්, දරුවාගේ ඉඹලා ගඳ සුවඳ කියන්න පුළුවන්. දරුවා කැමැති මේ රසට යි කියලා දරුවාගේ රස තේරෙණ කොට, 'ආ මගේ දරුවාත් මේ රසට කැමැති යි' කියලා නිමිත්ත ඒකටත් තියා ගත හැකි යි. අතින් අහුවෙන කොට මේ දරුවාගේ හැඩය දරුවා මම අල්ලනවා, දරුවා මගේ ඇඟේ එල්ලෙනවා කියලා එහෙමත් සතුටු වුණ හැකි යි. ඔය පහ ම එකතු කරලා හිතලාත් සතුටු වුණ හැකි යි. දරුවෙක් එක්ක සතුටු වෙන්න පුළුවන්.

ආදීනව තමයි දරුවා ලෙඩවෙලා, මහලු වෙලා, මැරිලා එන දුක්, දරුවාට පිහියෙන් ඇන්නොත්, ගැහුවොත්, බැන්නොත්, අසාධාරණ කම් කළොත්, සතරමහාධාතු රූපය ඕන විදියකට විනාශ වෙන්න කුඩුවෙන්න පුළුවන්. නමුත් මම සෙල්ලම් කරන්නේ ඒ රූප මිටිය

එක්ක දරුවෙක්ව හඳුගෙන නම් මට රිදෙයි. මගේ දුකට හේතුව ජාතිය යි. දරුවෙක්ව උපදවා ගැනීම යි. ආර්‍ය ශ්‍රාවකයා දන්නවා, ජාතිය දුකක්. ***ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති.*** ඉපදීම දුකක් කියලා ආර්‍ය ශ්‍රාවකයා හොඳට දන්නවා. දුකෙන් මිදෙන්න නම් තියෙන එක ම ක්‍රමය මොකක් ද? ***ජාති නිරොධො*** - නූපන්නොත් විතරම යි කියලා දන්නවා.

ලෝකයා ජාතිය දකින්නේ සතරමහාධාතු රූප මිටිය පහළවෙච්චි එකෙන්. නිරෝධය දකින්නේ සතරමහාධාතු රූප මිටිය නැතිවීම යි. නමුත් ආර්‍ය ශ්‍රාවකයා සතරමහාධාතු රූප මිටිය තියෙද්දි ම, මොක ද, ජාතිය - ඉපදීම නැතිවෙන්න ක්‍රම දෙකක් තියෙනවා කියලා දැක්කා නේ අපි. මේ ගතිය තියෙද්දී රූපය නැති වුණත් ඉපදෙන්නේ නැහැ. රූපය තිබුණත් හිතේ ගතිය නැතිවුණොත් ජාතිය නැහැ. ඒ කියන්නේ රූපය පිරිසිඳ දැකලා හිතේ ගතිය අයින් කරලා ජාතියෙන් මිදෙනවා. ඒකට කිව්වා සෝපදිසේස නිබ්බාන කියලා. ඊට පස්සේ රූපයේ ගතිය උපදින එකත් නතර කරනවා.

දැන් ඔය ඇත්තන්නට 'නිවන' කියන එක තේරෙනවා ද? නිවන් දැකලා තියෙනවා. දැක්කා ද ඔය පින්වතුන්? නිවන කියලා කිව්වේ වෙන මොකුත් නෙවෙයි, කල්‍යාණ මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම ශ්‍රවණයෙන් ජාතිය දුකක්, ජාතිය නිසා එන මේ දුක දුකක්. ඒ දුකට හේතුව ජාතිය යි. ජාතියට හේතුව තණ්හා-උපාදාන කියන ගති ටික භවයට ප්‍රත්‍ය වීමෙනුයි ජාතිය ඇති වුණේ කියලා, දුකත් දුකේ ඇතිවීමත් පෙන්නන කොට එයාට පෙනෙනවා ඇස් ඇරලා, නුවණක් තියෙන කෙනෙකුට. නිවන පෙනෙනවා එයාට, ***ජාති නිරොධො.*** ජාතිය නිරුද්ධ වුණොත් අජරාමර යි. ***ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති.*** මේ දුක් නිරුද්ධවෙනවා කියලා දුකේ නිරෝධය, නිවන දකිනවා එයා. එයා දකිනවා තණ්හා-උපදාන කියන ගති ටික භවයට ප්‍රත්‍ය නො වුණොත්, සතරමහාධාතු රූපයට බැස නො ගත්තොත් ඉපදීම නැතිවෙනවා කියලාත් එයා නිවන දකිනවා. නිරෝධය නෙවෙයි ද ඒ? නිවන නෙවෙයි ද ඒ? නිවන යි.

දැක්කහම ඒ සඳහා සමථ කමටහනකින් හිත වඩ වඩා, සීලයක පිහිටලා රූපය පිරිසිඳ දකින්න වෑයම් කටයුතුයි කියන නුවණක් එනවා. මාර්ගයත් දන්නවා. එයා චතුරාර්ය සත්‍යය අවබෝධ වෙච්ච කෙනෙක්, නිවන් දැක්ක කෙනෙක්. කෙනෙකුට මේ මොහොතේ දකින්න බැරි නම්, මේ ක්‍රමය එයාට පැහැදිළි නම්, විශ්වාස නම්, එයාට කියනවා ශ්‍රද්ධානුසාරී කියලා. ඇත්ත යි, මේක මෙහෙම තමයි වෙන්නේ කියලා ශ්‍රද්ධාවක් තියෙනවා.

ලෝකයේ පිහිටා හිටින්න බැරි දර්ශණයක් නෙවෙයි, මේ 'නිවන' කියන එක. අපි නිවන අඳුරන්නේ නැතුව යි තිබුනේ. අපි නිවන කියලා, ශූන්‍යතාවයක්, හිස් බවක්, මොනවා හරි දෙයක් නේ පනවාගන්නේ. නමුත් බුදුරජාණන්වහන්සේ දේශනා කළේ නිවන කියන්නේ මොකක් ද? සකස් නො වෙච්ච බව යි. නො හටගත්ත බව යි. අනුප්පාදය යි. ජාති නිරෝධය යි - නිවනට කියන නම්.

නූපන්නොත්, හට නො ගත්තොත්, ඒ නිවන දෙ ආකාරයකින් පවතිනවා. කාම ලෝකය, රූප ලෝකය, අරූප ලෝකය කියන භවත්‍රය ම, භවත්‍රය තුළ තියෙන සත්ත්ව-පුද්ගල-දිව්‍ය-මනුෂ්‍යයින් කියන ටික නිරුද්ධ වෙන තැනට කියනවා සෝපදිසේස නිබ්බාන කියලා. කෙලෙස් ටික නැතිවෙනවා. ඊට පස්සේ ජීවිත අවසානයේ දී පිරිනිවන්පාන දවසක් තියෙ යි. ස්කන්ධ වශයෙන් ප්‍රතිසන්ධියට යන්න හේතුවකුත් නෑ, මතු ස්කන්ධ උපදින්නෙත් නැහැ. අනුපදිසේස පරිනිර්වාණය යි. එයා නිවන දන්නවා. සියලු ම අසංඛත ස්වභාවය සාක්ෂාත් වෙන්නේ, නො හටගන්නා බව සාක්ෂාත් වෙන්නේ, දුකේ නිරෝධය සාක්ෂාත් වෙන්නේ දෙ ආකාරයට යි. ගුරු බර, වැඩි බර තියෙන්නේ කොයි එකේ ද? ස්කන්ධ දුකේ ද? කෙලෙස් දුකේ ද? කෙලෙස් දුකේ යි. ඒ දුකේ තමයි අම්මා මැරිච්ච දුක, තාත්තා මැරිච්ච දුක, නින්ද, අපහාස, ඇනුම්, බැනුම්, තාඩන, පීඩන, ඇනුම්පද කිව්වා කිය යි, කේලම් කිව්වා කිය යි, දෙස් කිව්වා කිය යි, චරිත ඝාතනය කෙරුවා කිය යි, පිහියෙන් අනින්න ආවා කිය යි - මේ කියන කතා, ලෝකයේ තියෙන ඔක්කෝම දුක් ටික තියෙන්නේ ඒකේ යි.

ආර්ය ශ්‍රාවකයාට හොඳට ඇහැක් තියෙනවා. ඒ සියලු දුක් නැතිකරන්න, කාම ලෝකයේ, රූප ලෝකයේ, අරූප ලෝකයේ, ඒ

තුන් භූමියේ ම තියෙන දුක් නැතිකරන්න ක්‍රමය එයා දන්නවා. තණ්හා-උපාදාන කියන ගති ටිකට භවය ප්‍රත්‍යය වෙන්න දුන්නේ නැත්නම් ඉපදෙන්නේ නැහැ කියලා දන්නවා. එදා ඉඳන් එයා නිවන් මඟ වඩනවා කියලා කරන්නේ මොකක් ද මේ? ඉපදීම නැති කිරීමට උත්සාහවත් වෙනවා. පින්වතුන් රූපය සතරමහාධාතු වශයෙන් බලන්නේ ඇයි කියන එක පින්වතුන්ට තේරෙනවා ද? ඉපදීම නැති කරන්න යි.

යම් දවසක් තියෙ යි මේ ප්‍රතිපදාවේ අවසානයේ දී පින්වතුන්ට ම පෙනෙයි මේ ස්කන්ධ ටික හොඳට පිරිසිඳ දන්නවා. දූන් දෙවියන්, මනුෂ්‍යයන් උපදින්නේ නැහැ. රන් රිදී උපදින්නේ නැහැ. ඇහැ දූන් පෙනෙනවා හොඳට. රහතන් වහන්සේලා රහත් වුණා කියන්න, රහත් බව ප්‍රකාශ කරන්න ගන්නා පළමුවෙනි වචනය මොකක් ද? ***ඛීණා ජාති*** - ඉපදීම නැති වුණා කියන්න යි. මොක ද ඒ? ඉපදීම දුකක් කියන එක දැකලා යි ගියේ ඉපදීම නැතිකරන්න.

ඊට පස්සේ අනුපදිසේස පරිනිර්වාණයට තථාගතයන් වහන්සේ බණ කියන්නේ නැහැ. ධර්ම දේශනා කරන්න ඕනෑ නැහැ. අනුපාදා පරිනිර්වාණයට විතරයි බණ කියන්නේ. අනුපාදා පරිනිර්වානය කියන්නේ උපාදාන වශයෙන් කිසිවක් නො ගෙන මිදෙන තැනට යි.

එතකොට මම කිව්වේ ඒක යි, (මම දන්නේ නැහැ කී දෙනෙකුට තේරුනා ද, පෙනුනා ද කියලා.) නමුත් නුවණක් තියෙන කෙනෙකුට දේශනාවක් අවසානයේ දී නිවන් දකින්න පුළුවන්. නිවන කියලා කිව්වේ ඉපදීම නැති කරන එකට යි. හොඳට මේ අර්ථයේ දක්ෂ වෙන්න. පින්වතුන්ගෙත්, මගෙත් මේ විදියේ පුද්ගලභාවය, අපි නිකමට කිව්වොත් මෙතැන ඉන්න කොට, අපි කාට හරි වාතයක් ගියොත් ලජ්ජා හිතෙනවා නේ ද? ඇයි ඒ? තව සත්ත්වයින්, පුද්ගලයින් ඉන්න හින්දා යි. තමන් ඉන්න හින්දා යි. මේ ජාතියේ දෝෂය යි. පින්වතුන්ට ජාතිය නිරුද්ධ නම් ඒ වගේ තැනක ධර්මතාවයක් මිසක දුක නැහැ. උහුලගෙන, කාගෙන ඉන්නවා නෙවෙයි. දුක් වෙන්න එහෙම ධර්මයක් නැහැ. පින්වතුන්ට බනින්න මිනිස්සු නැහැ. බැනුම් අහන්න පින්වතුන් නැහැ. අහවලා ඔයාට මෙහෙම කිව්වා කියන කොට සතරමහාධාතුවේ අහවල්ලු ඉන්න

හින්දු නේ ද රිදෙන්නේ? තමන් ඉන්න හින්දු නේ ද මට එහෙනම් මෙහෙම කිව්වා කියන එක තියෙන්නේ? සෝපදිසේස නිබ්බාන කියන තැනින් ලෙහෙසි නිවීමක් නිවෙනවා ද කියන එක බලන්න. ලෙහෙසි ගින්නක් ද එහෙනම් දැන් මේ ඇවිලිලා තියෙන්නේ කියන එක බලන්න. අපේ ජීවිතය කියන්නේ ගිනි ගොඩක්. පංචඋපාදානස්කන්ධය කියන්නේ දුක් ගොඩක්. ගින්නක්. මේ ගින්න නිවාගන්න පුළුවන්.

අදහන්න දෙයක් නැහැ. වීර්‍ය්‍යය කළොත් ඒකාන්තයෙන් ම මේ ගින්න නිවෙනවා ම යි. හැබැයි පින්වතුන්ට එක වැඩක් ලැබෙනවාඃ චතුරාර්‍ය්‍ය සත්‍යය පින්වතුන් දන්නවා නේ. පින්වතුන්ට ගහක්-කොලක්, රන්-රිදී-මුතු-මැණික්, දූ දරුවන්, ගෙවල් දෙරවල් පෙනෙන තාක් පින්වතුන් දත යුතුයි මේ ජාතිය ස්වභාව කොට ඇති ධර්මයි කියන එකත්, ඔය ජාතියට හේතුව තණ්හා-උපාදාන-භව කියන එකත් දත යුතු ම යි. ඒක පෙනෙනවා. භවය කියන්නේ හැම වෙලේ ම, මේ කාම භවය කියන්නේ සතරමහාධාතු රූපය යි. තණ්හා-උපාදාන කියන ගති ටික භවයට ප්‍රත්‍ය නො වුණොත් ජාතිය නෑ. ගස්-ගල්, ගෙවල්-දෙරවල්-ඉඩකඩම්, ඉර-හඳ මොකුත් උපදියි ද? මොකුත් උපදින්නේ නැහැ. නිවන් කියන්නෙ ඉරත් නෑ, හඳත් නෑ, ගස් කොලන්, ආලෝක, අඳුර, මොලොව පරලොව මොකුත් නැහැ, උපදින්නේ නැහැ.

ඒ නිවන මේ ජීවිතයේ ම සාක්ෂාත් සාක්ෂාත් කරගන්න පුළුවන් ම යි. ඔය අර්ථය තියාගෙන පින්වතුන්ට බැලුවාට බැලුවාට දරුවා කියලා සිහි වෙනවා. බැලුවාට බැලුවාට එතන කුණප කොටස් පෙනෙන්නේ නැහැ. දරුවා කියලා ම යි පෙනෙන්නේ. හැබැයි පින්වතුන් ක්‍රමය දන්නවා දැන්. ශ්‍රද්ධානුසාරී කියලා කියන්නේ පෙනුනේ නැති වුණාට ක්‍රමය අදහනවා. ක්‍රමය එයාට පිළිගන්න පුළුවන්. ඒ කියන්නේ මේ ඉපදීම කියන්නේ මේ කුණප කොටස් ටිකත් නෙවෙයි මේ දරුවා කියන්නේ. හිතේ තියෙන ගතියත් නෙවෙයි මේ දරුවා කියන්නේ. මේ දෙක ම එකතුවෙච්චි නිසා ඇතිවෙන ධර්මතාවයක් කියන එක දකිනවා. මේක නැති කරන්න පුළුවන් කියලාත් දන්නවා. සම්මා දිට්ඨි. දැනගත්තාට ආශ්‍රව - ඒ රූපය දරුවා, දරුවා, දරුවා, දරුවා කියලා බලාපු වේගය තවම හිඳිලා නැහැ. ඒකට යි ආශ්‍රව කියන්නේ.

දැන් සිහිවෙන සිහිවෙන ගානේ රූපයේ ඇත්ත පෙන්නන එක විතරම ම යි තියෙන්නේ. ඒ ඇත්ත පෙන්නන කොට ආධ්‍යාහාරයෙන් චතුරාර්‍ය සත්‍යය තියෙනවා තමන්ගේ. දුකත් දන්නවා. දුකේ ඇතිවීමත් දන්නවා. නැතිවීමත් දන්නවා. නැති කරන මගත් දන්නවා. මේ මග. 'පඨවි' කියන වචනය විතරයි කියන්නේ නිවන් දකිනවා. ආධ්‍යාහාරයෙන් තියෙනවා අතේ. ඒක යි කෙස් රොද අතට කපලා 'කෙසා, ලොමා' කියන කොට රහත් වුණේ. අතීත ජීවිතවල දී මේ නුවණ හොඳට මුහුකුරලා. ඇයි? කෙසා, ලොමා කියලා බලන කොට කෙස්, ලොම් කියන්නේ පඨවි ධාතු යි කියලා දන්නවා එතකොට. මේ පඨවියේ කෙනෙක් කියන හැඟීම තිබුණොත් කෙනෙක් නිර්මාණය වෙලා දුක එනවා නේ ද? පඨවිය හැටියට බැලුවොත්, කෙස් හැටියට බැලුවොත් පුද්ගල භාවය ඒ මත පතිත වෙන්නේ නෑ. එහෙම වුණොත් පුද්ගලයින් උපදින්නේ නෑ දුක නැතිවෙනවා නේ ද කියන ටික ආධ්‍යාහාරයෙන් තියෙනවා. ක්ෂණිකව ඒ ටික මතුවෙනවා.

ඒ නිසා අනික් කට්ටියත් මේ ටික තේරුම්ගන්න බලන්න. මේක හරී වටිනවා. ඒ වටිනාකම මෙන්න මෙච්චර යි කියලා නිම කරන්න බැහැ.

මම කිව්වේ මගේ ජීවිතය ආයෙ ගැඹුරු ගැඹුරු අරුත් සොය සොයා මෙතැනින් එහාට යන්නේ නෑ. මේ කාරණාව ම සාර්ථක වෙයි සරල උපමා වලින් කියයි මිසක, මෙතැනින් එහාට යන්නේ නැහැ. නුවණක් තියෙනවා නම්, ඇස් තිබුණා නම්, මම ඔය ඇත්තන්ට නිවන පෙන්නුවා. ඔය ඇත්තන් නිවන දැකපු අයත් ඇති මෙතැන. එහෙම නැති නම් මේ ක්‍රමය ගැන යම් කිසි කෙනෙකුට තේරුණොත්, විශ්වාසයක් තිබුණොත් යටත් පිරිසෙයින් එයා දිට්ඨි සම්පන්න යි. ශ්‍රද්ධානුසාරී යි. අදහනවා. මේක වෙන්න පුළුවන් එකක්. මෙහෙම තමයි දුක ආවේ කියලා.

ඔය ටික විතරයි මට කියන්න තියෙන්නේ.

කවදාවත් ඔය ඇත්තන්ට වරදින්නේ නැහැ. ඔය ඇත්තන් වෙන නිවනක් හොයාගෙන යන්න එපා. මේ කතා කරන දෙය ම කල්‍යාණ මිත්‍ර ඇසුරෙන්, සද්ධර්මශ්‍රවණය කියන ටිකෙන් ලැබෙන්න

ඕන ඔය පණිවිඩය යි. නිවන කියන්නේ දකින්න පුළුවන් එකක්. ඉපදීම කියන්නේ මේ පින්වතුන්ගෙත්, මගෙත් මේ විදියට ඉපදීම යි. ඒ නිසා යි දුක ආවේ කියලා මේ පින්වතුන්ට පෙනෙන්නේ නැද්ද? පෙනෙනවා. මේ ඉපදීම මාව, ඔය ඇත්තන්ව, මේ දේවල්වල ඉපදීම නැති වුණොත් දුක නෑ කියන එකත් පෙනෙනවා නේ ද? එතකොට ඒකට තියෙන්නේ - සමුදය දුරුකිරීම නිරෝධය යි. තණ්හා-උපාදන කියන ගති ටික භවයට ප්‍රත්‍ය වුණොත් දුක උපදිනවා. තණ්හා-උපාදන කියන ගති ටික භවයට ප්‍රත්‍ය නො වුණොත් දුක උපදින්නේ නැහැ.

එතකොට මෙන්න මේ ටික හොඳට තේරුම්ගත්ත කෙනෙක් එක දේශනාවක් අවසානයේ දී දිට්ඨිසම්පන්න වෙනවා කියලා කියන්නේ දුක, දුක ඇතිවීම, නැතිවීම, නැතිකරන මග කියන චතුරාර්‍ය්‍ය සත්‍යය පෙනෙන එකට තමයි දිට්ඨිසම්පන්න යි කියලා කියන්නේ. නැත්නම් එයා නිවන් දැක්ක කෙනෙක්. ඉපදීම නැති වුණොත් ජරා-මරණ දුක නැතිවෙනවා. කෙලෙස් ටික ස්කන්ධ ටිකට පතිත නො වුණොත් උපදින්නේ නැහැ. මාර්ගය යි නිවන යි දැක්ක කෙනෙක්.

මම හිතන්නේ නිවන දැක්කා හෝ ඒක පිළිගන්න පුළුවන් මට්ටමක අය හරි මේ දේශනාව තුළ එක් කෙනෙක් හරි ඉදියි නේ. ඒ නිසා මට කියන්න තියෙන්නේ එච්චරයි. අපේ දෙස්තර මැණියන්ට තේරුණා ද? තේරුණේ නැත්නම් ටිකක් අහන්න. මේ මැණියෝ හරි ම පින්වන්ත යි.

අවුරුදු ගණනක් මම ධර්මය හොයාගෙන හොයාගෙන ආවත් මට අද තේරෙනවා නියම විදියට චතුරාර්‍ය්‍ය සත්‍යයට ලංවෙමින් තිබිලා තියෙනවා. නමුත් මට අවබෝධ වෙලා නෑ. මේ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ වුණහම එකක් තියෙනවා. මිනිස්සුන්ගේ මනසවල් තුළ වචන ගොඩවල් ගැහි ගැහී ගැහි ගැහී ඔහේ කියවාගෙන යන චරිත බිහිවෙන්නේ නැහැ. නිවැරැදි මාවතක් නැති වුණහම තියෙන ලක්ෂණය තමයි ගැඹුරු ගැඹුරු වචන එකතු කර කර එකතු කර කර ඔහේ හොය හොයා හොය හොයා යනවා මිසක නිෂ්ඨාවක් හම්බ වෙන්නේ නැහැ. නමුත් චතුරාර්‍ය්‍ය සත්‍යයේ නියම ලක්ෂණය එක දේශනාවක් අවසානයේ දී එයාට ජාති නිරෝධය පෙනෙනවා.

මේ කෙලෙස් ටික නිරුද්ධ කරලා සත්ත්ව-පුද්ගල-දේවල් වල ඉපදීම නැති කළ කෙනාට කිව්වා කවුද? රහතන් වහන්සේ කියලා. ඔය චතුරාර්‍ය්‍ය සත්‍යය දැකපු කෙනාට කිව්වා දිට්ඨි සම්පන්න යි. එයා සද්ධානුසාරි යි. සද්ධානුසාරි යි කියන්නේ මේ නිවන අදහනවා. මේ ක්‍රමය තේරෙනවා. ශ්‍රද්ධාව යි. තව කෙනෙක් ඉන්නවා දකින්න ම පුළුවන්. ඵලස්ථ වෙන්නත් පුළුවන්. නමුත් ඒ නැතත් අන්තිම අඩුම කෙනා, ධම්මානුසාරී - ශ්‍රද්ධාව නැතත් මෙහෙම ධර්මතාවයක් තියෙනවා කියලා ධර්මතාවයට හෝ නුවණ යි. මේක වෙන්න පුළුවන් දෙයක් කියලා අදහනවා - සද්ධානුසාරී. ඒ දෙන්නාත් සෝවාන් ඵලයට පත්වෙන තාක් මේ කල්පයවත් විනාශ වෙන්නේ නැහැ. ඒ අයට කියනවා ඨිතකප්පි පුද්ගලයින් කියලා.

ඉතින් කාලයක් ම හොයාගෙන හොයාගෙන ආවා මාත්. ආපු එකේ මම මෙතැනට එන කොට වෙනදට මෙහෙම යි භාවනා කරන්නේ කියන අර්ථයක් මට තියෙ යි. නමුත් මම මේ කුටියට ආපු පළමුවෙනි දවසේ ම සති නිමිත්තට මම හිත තියන කොට මට ඉබේ ම කමටහණක් පහළ වුණා, මෙහෙම යි ඔබ හිත තියන්න ඕන කියලා. මම හිතාගෙන හිටියේ නැහැ. ඒ ක්‍රමය විතරයි වැඩුවේ. ඒ වුණාට සතියක් යන කොට මේ ප්‍රශ්න ඔක්කෝම ලිහුණා.

ඉතින් මේ මැණියෝ හරිම පින්වන්ත යි. මුලු ලෝකයකට ම ඇස් දෙකක් පාදලා දෙන්න තරම් වාසනාවන්ත වුණා කියන එක කියනවා.

ඔය ඇත්තන් නුවණින් බලන්න, මම කතා කරන ප්‍රලාපයක් ද, නැති නම් මේක මෙහෙම වෙන්න පුළුවන් ද කියන එක. ඔය ඇත්තන් තුළින් බලන්න. ඔය ඇත්තන්ට දුක ආවේ කොහොම ද කියන එක. මේ වචනයක් වචනයක් ගානේ තමන් තුළින් බලන්න. ඔය ඇත්තන්ට දරුවා මළ දුක, මව් මළ දුක, පියා මළ දුක උපදිනවා නම් උපදින්නේ මට අම්මෙක්, තාත්තෙක්, දරුවෙක් ඉන්න හින්ද නේ ද කියලා බලන්න. මට අම්මා-තාත්තා-දරුවා හම්බ වුණේ කොහොම ද? රූපය සතරමහාධාතු යි. කෙලෙස් ටික මෙහේ මම ගාව තියෙන මේ අදහස් ටික මෙහෙම පතිත කරලා නේ ද 'මම' හදගෙන තියෙන්නේ කියන එක ඔය ඇත්තන්ට පෙනෙයි, ඔය

ඇත්තන් දුක් විඳපු හැටිත්, දුක හැදුන හැටිත් මේ ඔය ඇත්තන්ට පෙන්නන්නේ.

ඊට පස්සේ ඔය ඇත්තන්ට ඔය දුක් නැතිවෙන්න නම් ඔය වස්තු දේවල්, තමන්ගේ ඉපදීම නැතිවෙන්න ඕන. ඉපදීම නැතිවෙන්න නම් භවය - මේ සතරමහාධාතු රූපයට යි කාම භවය කියන්නේ. ඒ භවයට තමන්ගේ හිතේ තියෙන තණ්හා-උපාදාන කියන ගති ටික ප්‍රත්‍ය නො වෙන්න ඕන.

තණ්හා-උපාදාන ගති හඳුනාගන්න හරි ලෙහෙසි යි. පින්වතුන් පැත්තක ඉඳන් සිහි කරන්න, රත්තරන්-රිදී-මුතු-මැණික්-දරුවන් කියලා. සිහි කරන කොට ඒ සිහි කරන නිමිත්තත් එක්ක කැමැත්ත, අකැමැත්ත කියන ගති හම්බ වෙයි. මේ ලෝභකම, ද්වේශය මේ නිමිති තෝරාගන්න පහසුයි. ඒ නිමිත්ත මහාභූත ටිකට තිබ්බහම ජාතිය යි. තරහකාරයින් උපදවාගන්න පුළුවන්. කැමැති අය උපදවාගන්න පුළුවන්.

ඊගාව දේ තමයි, තණ්හා-උපාදාන කියන ඔය ගතිවලට විතරක් නෙවෙයි, පසාද අධිමොක්ඛ කියන ගතියටත් භවය හැදෙනවා. ***භව පච්චයා ජාති. ජාති පච්චයා ජරා මරණං*** වෙනවා. කුසල සිතකත් ඔය ඇත්තන්ට තණ්හා-උපාදාන නැහැ. නමුත් කුසල සහගත නිමිත්තක් ගත්තොත් ඒ නිමිත්ත සතරමහාධාතුව මත පතිත වුණොත්, කුසල සහගත අරමුණු උපදි යි. ඒත් තමන් උපදිනවා, ජරා-මරණ දුක තියෙ යි. ඒ පැත්ත අතහරින්න. ඕන නැහැ. තණ්හා-උපාදාන කියන පැත්ත විතරක් මතක් කළේ, කෙලෙස් පැත්ත විතරක් අතහරින්න. අනිත් ඒවා අතහැරෙයි. අතහරින්න යන්න එපා. නමුත් සංඛත - කෙළවරට යන කොට **පුඤ්ඤ පාප පහීනස්ස** කියන දෙපැත්ත ම අතහැරෙනවා. (තේරුණා නේ ද කියපු එක?)

ඔය ටික තව කතා කරන්න. මම කතා කරන දෙය පිරිසිදු බුදුදහම නම්, බලංගොඩින් පටන්ගත්ත මේ දර්ශණය මේ මුළු ලොකයේ එහා කෙළවරට ගිහිල්ලා නතර වෙන්නේ. (සාදු සාදු) මොක ද බුදුරජාණන්වහන්සේගේ ධර්‍මයේ එක ලක්‍ෂණයක් තියෙයි. ***විවටො විරොචති, න පටිච්ඡන්නො*** - හඳ වැහිලා තිබුණොත් බබලන්නේ නැහැ. විවෘත වුණොත් බබලනවා. ඉර වැහිලා තිබුණොත්

බබලන්නේ නැහැ. විවෘත වුණොත් බබලනවා. තථාගත ධර්මය වැහිලා තියෙනකම් බබලන්නේ නැහැ. විවෘත වුණොත් බබලනවා.

අද නෙවෙයි මේකට තැන එන්නේ. මේ දර්ශණය අහගෙන මේකේ ටික ටික හරි ප්‍රායෝගිකව යෙදෙන මනස් තව ටික කලක් යන කොට හොඳට මුහුකුරනවා. මල් පිපෙනවා වගේ ඒ අය තව අයටත් කියනවා. මේ ජරා-මරණ දුකෙන් එතෙර වෙන නිවන් මග ලෝකයේ උපන්නා කියන එක මට භය නැතුව අද කියන්න හැකි යි. (සාදු සාදු) ඒක මම කිව්වාට නෙවෙයි, ඔය ඇත්තන් ම බලන්නකෝ ඇත්ත ද නැත්ත ද කියලා. ඔය ඇත්තන්ට තේරෙයි නේ. ඕක කියන්න ඕන ඇත්තට ම මම නෙවෙයි. බණ අහන අය යි. බුදුරජාණන්වහන්සේ නෙවෙයි කිව්වේ, බුදුරජාණන්වහන්සේ ගේ බණ අහන අයයි කිව්වේ ***ස්වාක්ඛාතො භගවතා ධම්මො*** කියලා. සාන්දිට්ඨික යි, අකාලික යි, එහි පස්සික යි, ඕපනයික යි කියලා. තමා කෙරෙහි ම දක්ක යුතු යි කියලා.

ඒ ගුණ ටික නැද්ද කියලා බලන්න. වෙන විස්තර මහා රාශියක් හොයන්න එපා. මහා රාශියක් නාම ධර්ම පහුරු ගගා යන්න එපා. මහා රාශියක් කරුණු හොයන්න එපා. සරල වෙන්න. කාම භවයෙන් එතෙර වෙන්න මේ සත්පුරුෂ ඇසුරෙන්, කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් සද්ධර්මය ලැබුණහම, වීර්‍ය්‍යය විතරයි අවශ්‍ය. බොහෝ ධර්ම කරුණු අවශ්‍ය නැහැ. හොඳට ඔය ඇත්තන්ට හිත තබන්නට පුළුවන් මේ හැම දෙයක් ම සුඤ්ඤතාවය යි. අවකාශ ධාතුව අහුරාගෙන සතරමහාධාතු රූප රාශිවෙලා තියෙන එක එක හැඩ නේ ද කියලා හිත තබන්න. හැබැයි ඔය ඇත්තන් දන්නවා ඒකට අමතරව ගහ, පොළොව, ගල්කැටයක් කියලා හරි හිත තැබුවොත් ඉපදිලා. ඒත් දෙයක් ඉපදිලා. හැම දෙයක් ම, මේ ලෝකය ඇසුරු කරණ හැම දෙයක් ම, ජාතිය ස්වභාව කොට ඇති ධර්මයි කියලා ඔය ඇත්තන්ට තේරෙන්න ඕන. ***ජාති නිරොධො*** කියන කොට කාම ලෝකයේ කිසිදු දෙයක් ඉතුරු වෙන්න බැහැ. ඉඳිකටු තුඩ කියන එකත් ඉපදිච්ච දෙයක්.

ඒ නිසා මේ ටික අහලා හැම දෙනා ම සසර දුකෙන් එතෙර වෙන්න උත්සාහවත් වෙන්න කියන එක මතක් කරනවා. ඔය ඇත්තන්ගෙයි අඩුව තියෙන්නේ. කල්‍යාන මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම

ශ්‍රවණය කියලා - මේ සාසනයට මොන විදියට හරි ස්වාමීන් වහන්සේලාව ජීවත් කෙරුවා නම්, කන්න දීලා, බොන්න දීලා, සිව්පසයෙන් ඔය ඇත්තන් දුක් මහන්සියෙන් හරි හම්බ කරන දෙයින් ස්වාමීන් වහන්සේලාට උපස්ථාන කෙරුවා නම්, සමස්ථයක් ම සංඝයාට කළ උපකාර වෙනුවෙන් ඒ ණය බේරුවා මම අද, ඔය ඇත්තන්ට මේ ටික තේරුණා නම්. (සාදු සාදු) මගේ විතරක් නෙවෙයි. යම් තාක්, ඕනෑම තැනක ස්වාමීන් වහන්සේලාට උපකාර කරන්න සංසරත්නය ලෝකයේ ජීවත් කෙරුවාට ඔය ඇත්තන්ට අජරාමර නිවනේ පණිවිඩය ලබලා දීලා තියෙයි. තේරුණේ නැතිනම් තේරුම්ගන්න උත්සාහවත් වෙන්න.

ඒත් තේරුනේ නැත්නම් මගේ පස්සෙන් එන්න එපා. මගේ දේශනා මීට වඩා නැහැ. වෙන ක්‍රමයක් හොයන්න.

මම කිව්වේ ඒක යි මේ මගේ අවසාන කෙළවර ඇවිල්ලා හැපිලා තියෙන. මෙතැනින් එහාට මගේ දේශනා ගැඹුරු වෙන්නේ නැහැ. මම කවදාවත් ඔය ඇත්තන්ට එහෙම කියලා නැහැ නේ. හැම කලින් කලට ම, කලින් කලට ම භාවනා කරලා ඊට වඩා ගැඹුරක්, ඊට වඩා ගැඹුරක්, ඊට වඩා ගැඹුරක් ආවා. දැන් ඊට වඩා ගැඹුරක් නැහැ. මේ කියන අර්ථය සමහර විට එක එක සූත්‍ර වලින්, එක එක ක්‍රම වලින් කියයි. ඒත් මේක ම යි. මේක ලිහිල් කරලා දෙන්න උපමා උපමෙයා සමහර විට හම්බ වෙයි.

තාම මමත් ආධුනික යි. නමුත් මෙයින් ඔබ්බට යන්නෙ නෑ. ඒ නිසා මේ කියලාත් තේරුණේ නැතිනම්, පිළිගන්න අපහසු නම් මේක නිවන නෙවෙයි කියලා, මගේ එහෙම මනාපයක් අමනාපයක් නැහැ. ධර්මතාවය ඒක යි.

ඉතින් හැමෝට ම මතක් කරනවා, මාව බලාගෙන කියන්නේ ඒ ස්වාමීන් වහන්සේ අපට තව හොඳ කරුණු ටිකක් කියලා දෙයි. තව ගැඹුරු බණ ටිකක් කියලා දෙයි කියලා මගේ පස්සෙන් එන්න එපා. මෙතැනින් එහාට මට ඔය ඇත්තන් වෙනුවෙන් යමක් කරන්න බැහැ. ලෝකයා වෙනුවෙන් යමක් කරන්න බැහැ. මට කරන්න පුළුවන්, කරන්න දන්න එක ම දේ, මගේ බුදුරජාණන්වහන්සේගේ

පණිවිඩය, මෙච්චර යි මම දන්නේ. ඔය ටික විතරයි මට කියන්න පුළුවන් කියන එකත් මතක් කරනවා.

ඒ නිසා අදින් පස්සේ, මේ වස් කාලයෙන් පස්සේ, ධර්ම පර්යේශණය මගේ ඉවරයි. මේ තාක් මම ධර්ම පර්යේශණයක යි ආවේ. මග හොයමින් ආපු කෙනෙක්. මම හැමදම කිව්වා නේ. මාත් මේ නිවන් දකින්න යන ගමනක්, ඒකේ පණිවිඩය කියනවා කියලා. අදින් පස්සේ මගේ පර්යේශණ ඉවරයි. දැන් තියෙන්නේ මගේ ප්‍රතිපදාව යි. ඒ නිසා ඔය ඇත්තන් පුළුවන් නම් අහලා ප්‍රතිපදාවේ ඊට පස්සේ මම එක්ක එන්න. එහෙම නැතුව මේක මදි නම් හොයන කට්ටිය මාව අතහරින්න වෙනවා. මගේ ක්‍රම අතහරින්න වෙනවා. වෙන පැත්තකට ගියාට අමනාපයක් නැහැ. මං පස්සේ ආවාට වැඩක් නැහැ කියන එකත් මතක් කරනවා.

මේ වස් කාලයේ කුටිය හදලා විවේකය අරගෙන දීලා, මුලු ලෝකයට ම - ලෝකයට ම වටිනවා ද මං දන්නේ නැහැ. මට වටි යි. මේ සාසනය ලෝකයේ ජීවත් කරන්න ඇහැක් මට උපදවාගන්න හදලා දුන්නු අපේ පින්වත් ශ්‍රියාණි මැණියන්ට මේ ජීවිතයේ දී ම අජරාමර නිවන් සැප ලැබේවා! ඒ දියණියටත්, එතුමියගේ මහත්මයාටත් ඒ වාගේම ඒ ගෙදර ඉන්න අපේ මේ ශ්‍රියාණි දෙස්තර නෝනා මහත්මාගේ මහත්මයාට, නැත්නම් කිශාණි නෝනාගේ පියාණන්ටත් ඇතුළු ඒ පවුලේ සියලු දෙනාටත්, දකලා බලලා උදව් උපකාර කරපු සියලු දෙනාටත් මේ ජීවිතයේ දී ම උතුම් නිර්වාන සම්පත්තිය ක්ෂාත් ක්ෂාත් වේවා!

අපේ පින්වත් ස්වාමීන් වහන්සේලාත් මම වෙනුවෙන් හරියට කැප වෙනවා, ඒ සද්ධාතිස්ස හාමුදුරුවෝ, ධම්මජෝති හාමුදුරුවෝ, සුදස්සි පොඩි හාමුදුරුවෝ, පින්වත් ස්වාමීන් වහන්සේලාටත් මේ කුසලය උතුම් නිවන් පිණිස ම පාරමිතාවක් වේවා!

මම මේ කියන දේ සැබෑවට ම බුදු දහම ද නැද්ද, මේ හම්බවුණේ නිවනේ පණිවිඩය ම ද කියලා ඔය ඇත්තන් තමන් තුළින් විමසලා බලන්න. එතකොට සැක සංකා තියෙනවා නම් දුරුවෙයි.

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

ලෙහෙසි ගින්නක් ද එහෙනම් දැන් මේ ඇවිලිලා තියෙන්නේ කියන එක බලන්න. අපේ ජීවිතය කියන්නේ ගිනි ගොඩක්. පංචඋපාදානස්කන්ධය කියන්නේ දුක් ගොඩක්. ගින්නක්. මේ ගින්න නිවාගන්න පුළුවන්.

අදහන්න දෙයක් නැහැ. වීර්‍යය කළොත් ඒකාන්තයෙන් ම මේ ගින්න නිවෙනවා ම යි.

ලෝකයේ පිහිටා හිටින්න බැරි දර්ශණයක් නෙවෙයි, මේ 'නිවන' කියන එක. අපි නිවන අඳුරන්නේ නැතුව යි තිබුනේ. අපි නිවන කියලා, සුඤ්ඤතාවයක්, හිස් බවක්, මොනවා හරි දෙයක් නේ පනවාගන්නේ.

නමුත් බුදුරජාණන්වහන්සේ දේශනා කළ නිවන කියන්නේ මොකක් ද? සකස් නො වෙච්චි බව, නො හටගත්ත බව, අනුප්පාදය, ජාති නිරෝධය - මේ නිවනට කියන නම්.

මේ චතුරාර්‍ය සත්‍යය අවබෝධ වුණහම එකක් තියෙනවා. මිනිස්සුන්ගේ මනසවල් තුළ වචන ගොඩවල් ගැහි ගැහී ගැහි ගැහී ඔහේ කියවාගෙන යන චරිත බිහිවෙන්නේ නැහැ. නිවැරැදි මාවතක් නැති වුණහම තියෙන ලක්ෂණය තමයි ගැඹුරු ගැඹුරු වචන එකතු කර කර එකතු කර කර ඔහේ හොය හොයා, හොය හොයා යනවා මිසක නිෂ්ඨාවක් හම්බ වෙන්නේ නැහැ. නමුත් චතුරාර්‍ය සත්‍යයේ නියම ලක්ෂණය එක දේශනාවක් අවසානයේ දී එයාට ජාති නිරෝධය පෙනෙනවා.